# 7 මුදල් ප්‍රතිපත්තිය, මුදල්, ණය සහ පොලී අනුපාතික

## 7.1 සමස්ත නිරීක්ෂණ

අඛණ්ඩව තෙවන වසරටත් උද්ධමනය අඩු මට්ටමක පැවතීමේ වාතාවරණයක් තුළ මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2011 ජනවාරි මාසයේ දී ලිහිල් කළ නමුත්, පුරෝකථනය කළ අගයන් ඉක්මවමින් ණය හා මුදල් සමස්ත වර්ධනය වූ බැවින් මහ බැංකුව විසින් ඉන්පසුව සුපරීක්ෂාකාරී හා ක්‍රමික ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කරන ලදී. 2011 ජනවාරි මාසයේ දී ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික, පිළිවෙළින් පදනම් අංක 25 කින් හා පදනම් අංක 50 කින් තවදුරටත් අඩු කිරීමත් සමග ආර්ථික වර්ධනය සඳහා පැවති හිතකර පසුබිම, වඩාත් ශක්තිමත් කරන ලදී. කෙසේ වෙතත්, මෙරටට ගලා ආ විදේශ විනිමය වැඩි ප්‍රමාණයක් මහ බැංකුව විසින් මිලදී ගැනීම හේතුකොට ගෙන දේශීය මුදල් වෙළෙඳපොළ තුළ දිගින් දිගටම පැවති ඉහළ ද්‍රවශීලතාව පිළිබඳව සලකා බලා එයින් කොටසක් ස්ථාවර පදනම මත අවශෝෂණය කිරීම සඳහා මෙන්ම මහ බැංකුවේ ප්‍රතිපත්ති දිශාව සංඥා කිරීම සඳහා 2011 අප්‍රේල් මාසයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් මත අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක එකකින් ඉහළ දමන ලදී. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථායීතාව රැකගැනීම සඳහා මහ බැංකුව විසින් වසරේ අග භාගය තුළ දී වෙළෙඳපොළට විදේශ විනිමය සැපයීම හේතුවෙන් වෙළෙඳපොළ ද්‍රවශීලතාව තවදුරටත් අඩු විය. මෙම ක්‍රියාමාර්ග අතිරික්ත ද්‍රවශීලතාව අඩු කිරීමට සමත් වූ අතර, කෙටිකාලීන පොලී අනුපාතික ව්‍යුහය ඉහළ යාමට මෙය හේතු විය. තවදුරටත් ණය වර්ධනයේ අඩු වීමක් පෙන්නුම් නොකිරීමත් සමග මහ බැංකුව ශිෂ්ට ප්‍රයෝග වෙත යොමු වූ අතර, අතිරික්ත ද්‍රවශීලතාව අඩුවීමත් සමග කෙටිකාලීන පොලී අනුපාතිකවල ඇති විය හැකි උච්චාවචන වළක්වා උචිත මට්ටමක පවත්වා ගැනීම සඳහා වසරේ අග භාගය වන විට විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික වෙන්දේසි නැවත ආරම්භ කරන ලදී. දිගින් දිගටම පැවති ඉහළ ණය වර්ධනය තුළින් වෙළෙඳ හිඟය හා සාර්ව ආර්ථිකය මත ඇතිවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා 2012 පෙබරවාරි මාසයේ දී මහ බැංකුව විසින් සිය ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පදනම් අංක 50 කින් ඉහළ නංවන ලද අතර, 2012 මාර්තු මාසයේ දී මුදල් නීති පනතේ 101(1) වගන්තිය යටතේ ණය වර්ධනය වඩාත් යෝග්‍ය මට්ටමක් දක්වා සීමා කරන ලෙස දන්වා බලපත්‍රලාභී බැංකු වෙත විධානයක් නිකුත් කරන ලදී.

**ඉහළ අන්තර්ජාතික වෙළෙඳ භාණ්ඩ මිල ගණන් හා දේශීය වශයෙන් වසර ආරම්භයේ දී පැවති අහිතකර කාලගුණික තත්ත්වය මධ්‍යයේ වුවද, උද්ධමනය 2011 වසරේ දී තනි අංකයක පැවතුණි.** උතුරු හා නැගෙනහිර පළාත් වලින් ඇතුළුව දේශීය ආහාර ද්‍රව්‍ය සැපයුම ඉහළ යාම, ස්ථායී විනිමය අනුපාතිකය, වෙළෙඳපොළ හවුල්කරුවන්ගේ හිතකර උද්ධමන අපේක්ෂාවන් මෙන්ම යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2011 වසරේ දී අඛණ්ඩව තෙවන වසරටත් උද්ධමනය තනි අංකයක පවත්වා ගැනීම සඳහා ඉවහල් විය.

**2011 වසරේ දී සංචිත මුදල් මෙන්ම පුළුල් මුදල් ද ඉලක්කගත මට්ටම ඉක්මවා වර්ධනය විය.** පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය විසින් ලබාගත් ණය, පුරෝකථනය කරන ලද මට්ටම ඉක්මවා ඉහළ යාම මෙම ඉහළ මුදල් ප්‍රසාරණයට හේතු විය. ආයෝජනයන්ට හිතකර වාතාවරණය පිළිබිඹු

කරමින් ආර්ථික කටයුතු ඉහළ යාම, ඉහළ ගිය දේශීය ඉල්ලුම, ආනයන සඳහා ඉල්ලුම වැඩිවීම, දිගින් දිගටම අඩු මට්ටමක පැවති පොලී අනුපාතික හා ණය ලබාගැනීමට ඇති හැකියාව ඉහළ යාම පෞද්ගලික අංශය විසින් ණය ලබාගැනීම සඳහා පැවති ඉල්ලුම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රජයේ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා බැංකු නොවන අංශයේ දායකත්වය පහළ යාමත් සමඟ බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශය ලබාගත් ණය ප්‍රමාණය වැඩි විය. බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම ණය ඉහළ යාම තුළින් මුදල් සැපයුම මත ඇති කරන ලද ප්‍රසාරණාත්මක බලපෑම යම්තාක් දුරකට සමනය කිරීමට සමත් විය.

වසර අවසානය වන විට දේශීය මුදල් වෙළෙඳපොළ තුළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව අඩුවීම මගින් පිළිබිඹු වූ මුදල් අංශයෙහි පැවති දැඩි බව හේතුවෙන් පොලී අනුපාතික ව්‍යුහය මත ඉහළ යාමේ පීඩනයක් ඇති විය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය වසරේ පළමු කාර්තු තුන තුළ දී බොහෝදුරට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව මධ්‍යයේ පැවති නමුත්, අවසාන කාර්තුව තුළ දී අතිරික්ත ද්‍රවශීලතාව ක්‍රමයෙන් පහත බැසීමත් සමඟ එය ඉහළ යන්නට විය. තැන්පතු හා ණය පොලී අනුපාතික වසරේ ප්‍රථම කාර්තු තුන තුළ දී සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවති නමුත් අවසාන කාර්තුවේ දී වැඩි විය. වසර අවසානය වන විට රාජ්‍ය සුරැකුම්පත් මත ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතික ඉහළ ගිය අතර රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය පෙර වසර හා සසඳන විට ඉහළට විතැන් වී වඩාත් තිරස්ව නැඹුරු වූ ස්වරූපයක් ගන්නා ලදී.

2012 වසරේ දී මුදල් ප්‍රතිපත්තිය හැසිරවීමේදී, විදේශීය මෙන්ම දේශීය යන දෙඅංශයෙන් උද්ගත විය හැකි අභියෝගවලට මුහුණදීම පිළිබඳව අවධානය යොමු කරනු ඇත. ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ නිසැක සළකුණු මෙතෙක් දක්නට නොමැති අතර අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ බලශක්ති මෙන්ම අනෙකුත් ප්‍රධාන වෙළෙඳ භාණ්ඩවල මිල ගණන් වැඩි විචලතාවන්ගෙන් යුක්තව ඉහළ මට්ටමක පවතියි. ගෝලීයව මෙන්ම දේශීය වශයෙන් ඇති විය හැකි අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ සැපයුමට අවහිරතා ඇති විය හැක. 2012 ආරම්භයේ දී යොදා ගන්නා ලද මුදල්, විදේශ විනිමය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ඉහළ වෙළෙඳ හිඟය හා එමඟින් විදේශීය අංශයේ සමතුලිතතාව මත ඇති වූ බලපෑම අවම වනු ඇතැයි අපේක්ෂා කරන අතර, අවශ්‍ය වුවහොත් සාර්වආර්ථික සමතුලිතතාව සුරක්ෂිත කරගැනීම සඳහා තවදුරටත් නිසි ක්‍රියාමාර්ග ගනු ඇත. මේ සමඟ කෙටිකාලීනව උද්ධමනය හා ආර්ථික වර්ධනය මත යම් ඍණාත්මක බලපෑමක් ඇති විය හැකි වුවද, මෙමගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ දිගුකාලීන ස්ථායීතාව පවත්වා ගත හැකි වනු ඇත.

## 7.2 මුදල් ප්‍රතිපත්තිය

2011 ජනවාරි මාසයේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කළ නමුත් ණය හා මුදල් සමස්තයන්හි ඉහළ වර්ධනය දිගින් දිගටම පැවතීම හේතුවෙන් මහ බැංකුව විසින් සිය ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රමයෙන් දැඩි කරන ලදී. ආර්ථිකය තුළ සිදුවෙමින් පවත්නා ව්‍යුහාත්මක වෙනස්වීම් මෙන්ම මහජනතාවගේ මූල්‍ය පුරුදු වෙනස්වීම් ද ආවරණය වන පරිදි වඩාත් විස්තීර්ණ ආර්ථික විශ්ලේෂණයක් සහ මුදල් විශ්ලේෂණයක් හඳුන්වා දෙමින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව තවදුරටත් සවිමත් කරන ලදී. මුදල් ගුණකය තුළින් මෙහෙයුම් ඉලක්කය වන සංචිත මුදල් සමඟ බැඳී පවතින, මුදල් ප්‍රතිපත්තියේ අතරමැදි ඉලක්කය වන පුළුල් මුදල් සැපයුම පිළිබඳව මහ බැංකුව විසින් අඛණ්ඩව අවධානය යොමු කරන ලදී. ණය හා මුදල් සමස්තයන්හි වර්ධනයන්, ආර්ථිකයේ සිදුවෙමින් පැවති වෙනස්කම්වලට සාපේක්ෂව විශ්ලේෂණය කරමින් උද්ධමනාත්මක පීඩන ඇති වීම වළක්වමින් ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයක් සඳහා යෝග්‍ය මට්ටමේ පවත්වා ගැනීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගනු ලැබිණි. පුරෝකථනය කරන ලද සාර්වආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගනිමින් පිළියෙළ කරනු ලබන මුදල් වැඩසටහන තවදුරටත් මුදල් මෙහෙයුම් කටයුතු සඳහා මග පෙන්විය. මුදල් ප්‍රතිපත්තියේ පාරදෘශ්‍යභාවය හා සඵලතාව වැඩිදියුණු කිරීම සඳහා මෙලෙස ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ඒ සඳහා පාදක වූ කරුණු පිළිබඳව මහජනතාව නිරන්තරයෙන් දැනුම්වත් කරන ලදී.

2011 සඳහා වූ මුදල් වැඩසටහන අනුව පුළුල් මුදල්හි සියයට 14.5 ක සාමාන්‍ය වර්ධනයක් අපේක්ෂා කළ අතර, මෙය දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත නාමික වර්ධනයට අනුරූපී විය. දළ දේශීය නිෂ්පාදිතයේ මූර්ත වර්ධනය සඳහා වූ මූලික පුරෝකථනයන්ට අනුව එය සියයට 8.5 ක් පමණ ද, දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකය සියයට 6 ක් පමණ ද වනු ඇතැයි අපේක්ෂා කළ අතර, මෙය පුළුල් මුදල් සැපයුමෙහි අපේක්ෂිත වර්ධනය සඳහා පදනම් විය. කෙසේ වුවද, ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය ඉහළයාම නිසා 2009 සිට මුදල් ගුණකයෙහි අඩුවීම හේතුවෙන් සංචිත මුදල්හි වර්ධනය සියයට 16.4 ක් පමණ වූ වඩාත් ඉහළ මට්ටමක පවතිණු ඇතැයි අපේක්ෂා කරන ලදී.

කෙසේ වුවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් මත පනවා ඇති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2011 අප්‍රේල් 29 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිශතාංක 1 කින් වැඩි කිරීමත් සමඟ මුදල් ගුණකය මත ඇති වන බලපෑම සමනය කිරීම සඳහා සංචිත මුදල්හි වාර්ෂික සාමාන්‍ය වර්ධන ඉලක්කය සියයට 19.5 දක්වා ඉහළ නංවන ලදී. වසර අවසානය වන විට මුදල් සැපයුමෙහි වර්ධන වේගයේ යම් අඩු වීමක් අපේක්ෂා කළ ද, දේශීය ණයෙහි පැවති ඉහළ වර්ධනය හේතුවෙන් මුදල් සමස්තයන්හි වර්ධනය ද ඉලක්කගත අගයට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

**මහ බැංකුව විසින් වසරේ මුල් කාලපරිච්ඡේදය තුළ දී අනුගමනය කරන ලද ප්‍රතිපත්ති ස්ථාවරය වඩාත් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක අවශ්‍යතාව පෙන්නුම් කරමින් ක්‍රමයෙන් ඒ දෙසට යොමු කරන ලදී.** පෙර වසර තුළ ලිහිල් කරන ලද ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ක්‍රියාත්මක කරමින් ඉදිරි උද්ධමනය සඳහා පවත්නා හිතකර පෙර දැක්ම සැලකිල්ලට ගෙන පෞද්ගලික අංශය විසින් ආර්ථිකයේ සිදු කරනු ලබන ආයෝජන වඩාත් දිරිගැන්වීමේ අරමුණෙන් මහ බැංකුව විසින් 2011 ජනවාරි මාසයේ දී සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කරන ලදී. මේ අනුව ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.00 දක්වා පදනම් අංක 25 කින් ද, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 50 කින් ද පහත දමන ලදී. කෙසේ වුවද, වෙළෙඳපොළ තුළ දිගින් දිගටම පැවති ඉහළ අතිරික්ත ද්‍රවශීලතාව හේතුවෙන් අඩු පිරිවැයෙන් යුතු ණය ලබා දීම ඉහළ යාමත් සමඟ ඉදිරියේ දී උද්ධමනාත්මක පීඩනයන් ඇතිවීමට ඇති හැකියාව සැලකිල්ලට ගත යුතු කරුණක් විය. මේ නිසා 2011 අප්‍රේල් මාසයේ දී මහ බැංකුව විසින් රුපියල් බිලියන 18 ක් පමණ ස්ථාවර පදනම මත වෙළෙඳපොළෙන් අවශෝෂණය කරමින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1 කින් ඉහළ දමන ලද අතර, මෙමගින් මහ බැංකුවේ ප්‍රතිපත්ති දිශාව වඩාත් දැඩි ස්ථාවරයක් වෙත වෙනස් වීම සංඥා කරන ලදී. මේ අතර, මුදල් සැපයුම මත ඇතිවන ප්‍රසාරණාත්මක බලපෑම අවම කිරීම සඳහා මෙන්ම අධික ණය වර්ධනය තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාව වෙත ඇති විය හැකි අවදානම සීමා කිරීම සඳහා සිය ණය කළඹ වඩාත් උචිත මට්ටමක පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව පැහැදිලි කිරීමට මහ බැංකුව විසින් වාණිජ බැංකු සමග සාකච්ඡා පවත්වන ලදී. වසර අවසානය වන විට වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව ක්‍රමයෙන් අඩු වීමත් සමඟ එයට ප්‍රතිචාර ලෙස වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගිය අතර, කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි වෙනස්වීම සුමටව සිදුවීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව පමණක් වෙළෙඳපොළෙහි පවත්වා ගැනීමට මහ බැංකුව විසින් කටයුතු කරන ලදී. කෙසේ වුවද, වසරේ අවසාන කාර්තුව වන විට අපේක්ෂිත පරිදි ණය වර්ධනය අඩු නොවූ බැවින් හා වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ යාමේ පීඩනයක් ඇති වූ බැවින් මහ බැංකුව විසින් 2012 පෙබරවාරි මාසයේ දී සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 බැගින් ඉහළ දමන ලදී. මේ අනුව වර්තමානයේ ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.50 ක් හා සියයට 9.00 ක් ලෙස පවතී. තවද, 2012 අග වන විට සිය ණය වර්ධනය සියයට 18 ක් හෝ ණය ප්‍රමාණය රුපියල් මිලියන 800 යන දෙකෙන් ඉහළ අගයට සීමා කරන ලෙස 2012 මාර්තු මාසයේ දී මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත මුදල් නීති පනතේ 101(1) වගන්තිය යටතේ විධානයක් නිකුත් කරන ලද අතර, එතෙරින් නව අරමුදල් සපයා ගනු ලබන බැංකු සඳහා මෙම සීමාව සියයට 23 ක් හෝ රුපියල් බිලියනය යන දෙකෙන් වඩා ඉහළ අගයේ පවත්වා ගැනීමට ද අවකාශ සලසා දී ඇත.

**7.1 සංඛ්‍යා සටහන**

**මෑතකාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග (2007 - 2012)**

වාර්ෂික පොලිය සියයට

| දිනය | ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය | ප්‍රතිවිකුණුම් අනුපාතිකය | ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (අ) | ප්‍රතිවිකුණුම් ගනුදෙනු මත පනවා ඇති දණ්ඩන පොලී අනුපාතිකය |
|---|---|---|---|---|
| 2007 පෙබරවාරි 23 | 10.50 | 12.00 | - | - |
| 2007 නොවැම්බර් 21 | - | - | - | 19.00(ආ) |
| 2008 ඔක්තෝබර් 13 | - | - | 9.25 (ඇ) | - |
| 2008 නොවැම්බර් 25 | - | - | 7.75 (ඈ) | - |
| 2009 ජනවාරි 12 | - | - | - | 17.00 |
| 2009 පෙබරවාරි 11 | 10.25 | 11.75 | - | 16.50 |
| 2009 පෙබරවාරි 24 | - | - | 7.00 (ඉ) | - |
| 2009 මාර්තු 18 | - | - | - | 14.75 |
| 2009 අප්‍රේල් 22 | 9.00 | - | - | 13.00 |
| 2009 මැයි 21 | - | 11.50 | - | ඉවත් කරන ලදි |
| 2009 ජූනි 16 | 8.50 | 11.00 | - | |
| 2009 සැප්තැම්බර් 11 | 8.00 (ඊ) | 10.50 (ඊ) | - | |
| 2009 නොවැම්බර් 18 | 7.50 | 9.75 | - | |
| 2010 ජූලි 09 | 7.25 (ඊ) | 9.50 (ඊ) | - | |
| 2010 අගෝස්තු 20 | - | 9.00 | - | |
| 2011 ජනවාරි 11 | 7.00 | 8.50 | - | |
| 2011 අප්‍රේල් 12 | - | - | 8.00 (උ) | |
| 2012 පෙබරවාරි 03 | 7.50 | 9.00 | - | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම්හි ප්‍රතිශතයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.
(ආ) 2007 දෙසැම්බර් 03 වැනි දින සිට බලපැවැත්වේ.
(ඇ) 2008 ඔක්තෝබර් 17 වැනි දිනෙන් ආරම්භ වන සංචිත සතියේ සිට බලපැවැත්වේ.
(ඈ) 2008 නොවැම්බර් 28 වැනි දිනෙන් ආරම්භ වන සංචිත සතියේ සිට බලපැවැත්වේ.
(ඉ) 2009 පෙබරවාරි 27 වැනි දිනෙන් ආරම්භ වන සංචිත සතියේ සිට බලපැවැත්වේ.
(ඊ) ව්‍යාපාරික කටයුතු අවසානයේ සිට බලපැවැත්වේ.
(උ) 2011 අප්‍රේල් 29 වැනි දිනෙන් ආරම්භ වන සංචිත සතියේ සිට බලපැවැත්වේ.

2011 අවසානය වන විට මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව ඉතා අඩු මට්ටමක් දක්වා පහත **බැසීමත් සමග වෙළෙඳපොළ පොලී අනුපාතිකවල ඇති විය හැකි දැඩි උච්චාවචනයන් සීමා කිරීම සඳහා වෙළෙඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට මහ බැංකුව විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී.** ණය ලබාදීම සඳහා අතිරික්ත ද්‍රවශීලතාව උපයෝජනය කිරීමට අමතරව විශේෂයෙන්ම ඛනිජ තෙල් ආනයන බිල්පත් පියවීමට පහසුකම් සැලසීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත විදේශ විනිමය සැපයීම හේතුවෙන් රුපියල් ද්‍රවශීලතාව පහත වැටිණි. වසර ආරම්භයේ රුපියල් බිලියන 110 ඉක්මවූ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව 2011 වසර තුළ දී ක්‍රමයෙන් පහළ වැටුණු අතර, දෙසැම්බර් මාසයේ ඇතැම් අවස්ථාවන්හිදි ද්‍රවශීලතාව ඍණ අගයක් ද ගනුලැබිය. මෙවන් තත්ත්වයක් උද්ගතවීමේ හැකියාව මහ බැංකුව පෙර සිට අපේක්ෂා කළ අතර, මේ අනුව වෙළෙඳපොළ පොලී අනුපාතිකවලට මග පෙන්වීමක් ලබාදීම සඳහා සැප්තැම්බර් මාසයේ සිට විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික වෙන්දේසි පවත්වන ලදී.

**පාරිභෝගික මිල උද්ධමනය අඛණ්ඩව තෙවන වසරටත් තනි අංකයක පැවති අතර, මේ සඳහා දේශීය සැපයුම් අංශයේ ඇති වූ සැලකිය යුතු වර්ධනයන් බොහෝදුරට දායක විය.** කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව මනිනු ලබන උද්ධමනය, පෙර වසර අග පැවති සියයට 6.8 ට සාපේක්ෂව 2011 අග වන විට සියයට 4.9 ක් විය. කෙසේ වුවද, 2011 මැද දක්වා පැවති ඉහළ උද්ධමනය පිළිබිඹු කරමින් වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2010 වසර අවසානයේ පැවති සියයට 6.2 සිට 2011 අවසාන වන විට සියයට 6.7 ක් දක්වා ඉහළ නගින ලදී. වසරේ ප්‍රථම භාගය තුළ දී පැවති ඉහළ උද්ධමනයට සැපයුම් අංශයේ ඇතිවූ යම් අවහිරතා හේතුවෙන් ආහාර හා පාන වර්ගයන්හි මිල ගණන් ඉහළයාම හේතු විය. කෙසේ වුවද, වසරේ දෙවන භාගයේ දී සැපයුම් අංශයේ ඇති වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් මෙම තත්ත්වය වෙනස් වූ අතර එය, ආහාර නොවන අනෙකුත් පාරිභෝගික භාණ්ඩයන්හි ඇති වූ මිල ඉහළයාම් යටපත් කිරීමට ද හේතු විය. මේ අතර, මූලික උද්ධමනය ද වසර තුළ දී තනි අංකයක පැවති අතර එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2010 අග පැවති සියයට 8.9 ට සාපේක්ෂව 2011 අග වන විට සියයට 4.7 ක් විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2010 අග පැවති සියයට 7.0 ක සිට 2011 අග වන විට සියයට 6.9 ක් දක්වා පහත බසින ලදී.

**7.1 රූප සටහන**

**ආහාර සහ ආහාර නොවන උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය)**
**කො.පා.මි.දර්ශකයෙන් ගණනය කරන ලද (පදනම: 2006/2007)**




**පෙර වසරවල මෙන්ම පාර්ශ්වකරුවන් හා මහජනතාව සමග සිදු කරනු ලබන සන්නිවේදන කටයුතු වැඩි දියුණු කරමින් තම ප්‍රතිපත්ති තීරණවල පාරදෘශ්‍යභාවය මෙන්ම සඵලතාව ඉහළ නැංවීමට මහ බැංකුව විසින් කටයුතු කරන ලදී.** එළඹෙන වසර සඳහා මෙන්ම මැදිකාලය සඳහා මහ බැංකුව ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග විදහා දැක්වෙන "මුදල් හා මූල්‍ය අංශ සඳහා ප්‍රතිපත්ති පෙර දැක්ම" අඛණ්ඩව පස්වන වරට 2011 වසර ආරම්භයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. මේ අතර, මහ බැංකු වාර්ෂික වාර්තාව හා මෑතකාලීන ආර්ථික ප්‍රවණතා වැනි වාර්ෂික වාර්තා තුළින් ආර්ථිකය පිළිබඳව වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයන් ඉදිරිපත් කරන ලදී. තවද, ජනමාධ්‍ය තුළින් නිකුත් කරන ලද නිරන්තර නිවේදන මෙන්ම විවිධ සම්මන්ත්‍රණවල දී මහ බැංකු නිලධාරීන් විසින් සිදු කරන ලද දේශන ආර්ථිකයේ පවත්නා නව ප්‍රවණතා, ගැටලුකාරී තත්ත්වයන් මෙන්ම නව ඉඩප්‍රස්ථා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා යොදා ගන්නා ලදී. මහ බැංකුව විසින් පසුගිය වසර කිහිපය තුළ දී මෙන්ම ආර්ථිකයේ මතුවෙමින් පවත්නා ප්‍රවණතා මෙන්ම එම තත්ත්වයන් නිරාකරණය කිරීමට ගත හැකි පියවර සහ එමගින් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳව පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ මාසික රැස්වීම්වලදී සාකච්ඡා කරන ලදී.

## 7.3 මුදල් සහ ණය සමස්තයන්ගේ ප්‍රවණතා

### මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව

**දේශීය මුදල් වෙළෙඳපොළ තුළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව වසර තුළ දී ක්‍රමයෙන් පහත වැටුණු අතර, 2011 දෙසැම්බර් අග වන විට එය සුළු හිඟයක් පෙන්වීය.** 2010 අග පැවති රුපියල් බිලියන 113.5 ක අතිරික්ත ද්‍රවශීලතාවට සාපේක්ෂව 2011 දෙසැම්බර් අග දී දේශීය මුදල් වෙළෙඳපොළ තුළ රුපියල් බිලියන 5.4 ක ද්‍රවශීලතා හිඟයක් වාර්තා විය. රජය විසින් සිදු කරන ලද එ.ජ.ඩොලර් බිලියන 1 ක

වටිනාකමින් යුත් ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල් උපයෝජනය කිරීම තුළින් 2011 ජූලි මාසයේ දී වෙළෙඳපොළට සැලකිය යුතු ද්‍රවශීලතාවක් එක් විය. කෙසේ වුවද, අඛණ්ඩව ඉහළ මට්ටමක පැවති දේශීය ණය ප්‍රසාරණය, 2011 අප්‍රේල් මාසයේ දී රුපියල් බිලියන 18 ක් පමණ අවශෝෂණය කරමින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1 කින් සියයට 8 දක්වා ඉහළ දැමීම සහ මහ බැංකුව විසින් දේශීය වෙළෙඳපොළ වෙත විදේශ විනිමය නිකුත් කිරීම යනාදිය හේතුවෙන් වසර තුළ දී ද්‍රවශීලතාව පහත වැටුණි. කෙසේ වෙතත්, වසරේ අවසන් කාර්තුව තුළ දී මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම හේතුවෙන් ද්‍රවශීලතාව අඩුවීම මන්දගාමී වූ අතර, මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි ස්ථායීතාව පවත්වාගැනීමේ අරමුණෙන් මහ බැංකුව විසින් 2011 සැප්තැම්බර් මස 19 වැනි දින සිට විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික වෙන්දේසි යළි ආරම්භ කරන ලදී. ඇතැම් දිනවල සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පැවතිය ද, හිඟයන්ට මුහුණදෙන බැංකු වෙත ද්‍රවශීලතාව ලබාදී වෙළෙඳපොළ පොලී අනුපාතික මත ඇතිවන ඉහළයාමේ පීඩනය සීමාකිරීම සඳහා ඔක්තෝබර් මාසයේ යම් අවස්ථාවන්හි ද දෙසැම්බර් තුළ දී වඩාත් නිරන්තරයෙන් ද ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීමට සිදු විය. ස්වකීය විචක්ෂණශීලී සීමාවන් හේතුවෙන් අන්තර්බැංකු වෙළෙඳපොළ තුළ ණය ලබා දීමට නොහැකිවූ ඇතැම් බැංකු කිහිපයක් සතුව පැවති මෙම අතිරික්ත ද්‍රවශීලතාව තවදුරටත් නිත්‍ය පහසුකම යටතේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය මත මහ බැංකුවෙහි තැන්පත් කරන ලදී.[1]

### සංචිත මුදල්

**2011 වසර තුළ දී සංචිත මුදල් තවදුරටත් ඉලක්කගත මට්ටමට වඩා වැඩි වේගයකින් වර්ධනය වූ නමුත් වසරේ අවසාන භාගය වන විට එහි යම් පහළ බෑසීමක් දක්නට ලැබුණි.** වසරේ පළමු මාස තුන තුළ දී සංචිත මුදල්හි වර්ධනය සියයට 18 කට වඩා අඩු මට්ටමක පැවතුණද, ඉන්පසුව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංචිත මුදල් සියයට 20 කට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. සංචිත මුදල්හි මෙම අඛණ්ඩ වර්ධනයට සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්හි වර්ධනය මෙන්ම මහ බැංකුවෙහි පැවති වාණිජ බැංකුවල තැන්පතු

[1] මෙම තත්ත්වය නිසා එක්දින මුදල් වෙළෙඳපොළ තුළ ඇති වන විකෘති තත්ත්වය මගහරවා ගැනීම සඳහා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලබන දිනයන්හි නිත්‍ය පහසුකම යටතේ ප්‍රතිමිලදීගැනුම් පහසුකම් ලබා දීම එක් සහභාගිත්ව ආයතනයක් සඳහා රුපියල් මිලියන 100 දක්වා 2012 මාර්තු 15 සිට බලපැවැත්වෙන පරිදි සීමා කරන ලදී.

**7.2 රූප සටහන**
**දේශීය මුදල් වෙළෙඳපොළෙහි එක්දින ද්‍රවශීලතා තත්ත්වය**




වර්ධනය වීම ද හේතු විය. 2011 අප්‍රේල් මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩිකිරීම සහ ඉහළ ගිය ණය ප්‍රසාරණය බොහෝදුරට පිළිබිඹු කරමින් මහජනයා වෙතැති තැන්පතු ඉහළයාම, මහ බැංකුවෙහි පැවති වාණිජ බැංකුවල තැන්පතු වර්ධනය වීමට හේතුවිය. 2011 තුළ දෛනික සංචිත මුදල්හි වාර්ෂික සාමාන්‍යය 2010 තුළ පැවති රුපියල් බිලියන 335.2 ට සාපේක්ෂව, රුපියල් බිලියන 409.2 ක් වූ අතර, එහි සාමාන්‍ය වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, සංශෝධිත ඉලක්කය වූ සියයට 19.5 සමග සැසඳීමේදී සියයට 22.1 ක් විය.

**වසර තුළ දී මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ බැවින්, වත්කම් අංශය අනුව බලන විට සංචිත මුදල්හි වර්ධනය ශුද්ධ දේශීය වත්කම්වල ඉහළයාම හේතුවෙන් සිදු විය.** මහ බැංකුව විසින් රජය වෙත ලබාදුන් ශුද්ධ ණය රුපියල් බිලියන 185.8 කින් ඉහළයාම සහ ප්‍රධාන වශයෙන් සමස්ත මහ බැංකු සුරැකුම්පත් ප්‍රමාණයම පියවීම හේතුවෙන් මහ බැංකුවේ අනෙකුත් ශුද්ධ වගකීම් රුපියල් බිලියන 58.8 කින් අඩුවීම බොහෝදුරට හේතුකොට ගෙන ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 244.4 කින් පමණ වර්ධනය විය. මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 167.7 කින් සැලකිය යුතු ලෙස වැඩිවීම සහ මහ බැංකුව විසින් රජය වෙත වසර තුළ දී තාවකාලික අත්තිකාරම් ලෙස රුපියල් බිලියන 16.9 ක් ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වර්ධනය විය. ප්‍රධාන වශයෙන්, දේශීය වෙළෙඳපොළ වෙත විදේශ විනිමය සැපයීම සහ ආසියානු නිෂ්කාශන සංගමය වෙත පැවති වගකීම් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2011 වසර තුළ දී රුපියල් බිලියන 165.4 කින් අඩු විය.

**7.2 සංඛ්‍යා සටහන** **මුදල් සමස්තයන්හි ප්‍රවණතා**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2010 අවසානයට | 2011 අවසානයට (අ) | වෙනස 2010 ප්‍රමාණය | වෙනස 2010 % | වෙනස 2011 ප්‍රමාණය | වෙනස 2011 % |
|---|---|---|---|---|---|---|
| 1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 255.7 | 293.2 | 38.2 | 17.6 | 37.6 | 14.7 |
| 1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 216.5 | 242.9 | 34.7 | 19.1 | 26.3 | 12.2 |
| 1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 39.1 | 50.4 | 3.5 | 9.9 | 11.3 | 28.8 |
| 2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු | 104.9 | 146.3 | 18.8 | 21.8 | 41.4 | 39.5 |
| 3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ආ) | ... | ... | ... | | ... | |
| **4. සංචිත මුදල් (1+2+3)** | **360.5** | **439.5** | **57.0** | **18.8** | **79.0** | **21.9** |
| 5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 190.6 | 195.8 | 35.8 | 23.1 | 5.2 | 2.7 |
| **6. පටු මුදල් සැපයුම $M_1$ (1.1 + 5)** | **407.2** | **438.7** | **70.5** | **20.9** | **31.5** | **7.7** |
| 7. මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 1,405.8 | 1,753.9 | 205.8 | 17.1 | 348.1 | 24.8 |
| **8. පුළුල් මුදල් සැපයුම $M_2$ (6+7)** | **1,813.0** | **2,192.6** | **276.2** | **18.0** | **379.6** | **20.9** |
| 9. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඇ) | 278.4 | 299.1 | 9.0 | 3.3 | 20.7 | 7.4 |
| **10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම $M_{2b}$ (8+9)** | **2,091.4** | **2,491.7** | **285.2** | **15.8** | **400.3** | **19.1** |
| **මුදල් ගුණකය $M_{2b}$** | **5.80** | **5.67** | | | | |
| **සංසරණ ප්‍රවේගය $M_{2b}$ (ඈ)** | **2.92** | **2.85** | | | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු 2010 වසර අවසානයේ දී රුපියල් මිලියන 5.71 ක් ලෙසද 2011 අවසානයේදී රුපියල් මිලියන 1.75 ක් ලෙසද පැවතුණි.
(ඇ) අක්වෙරළ බැංකු ඒකකයන්හි නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හඳුනාගත් කොටසක් ඇතුළත් වේ.
(ඈ) වසර තුළ දී මුදලෙහි සංසරණ ප්‍රවේගය

## පටු මුදල් සැපයුම ($M_1$)

2011 වසරේ ප්‍රථම භාගය තුළ දී ස්ථායීව පැවති පටු මුදල් සැපයුමෙහි ($M_1$) වර්ධනය, වසරේ අවසාන භාගයේ දී පහත වැටුණි. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත පටු මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2010 අවසානයේ දී පැවති සියයට 20.9 ට සාපේක්ෂව 2011 දෙසැම්බර් මාසයේ දී සියයට 7.7 ක් ලෙස වාර්තා විය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්හි වර්ධනය 2010 අවසානයේ පැවති සියයට 19.1 ට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 12.2 දක්වා අඩු විය. එමෙන්ම, මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතුවල වර්ධනය, 2010 අවසානයේ පැවති සියයට 23.1 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.7 දක්වා අඩු වූ අතර, විශේෂයෙන්ම වසර අවසානය වන විට වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළයාම මෙම අඩුවීමට හේතු වන්නට ඇත.

## පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)

පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2010 අවසානයේ දී පැවති සියයට 15.8 ක වර්ධනයට සාපේක්ෂව 2011 දෙසැම්බර් අවසාන වන විට සියයට 19.1 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තාකරමින්, 2011 වසරේ දී අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ වේගයකින් වර්ධනය විය. එම නිසා පුළුල් මුදල්හි වාර්ෂික සාමාන්‍ය වර්ධනය, මුදල් වැඩසටහනට අනුව වූ සියයට 14.5 ක ඉලක්කගත මට්ටමට සාපේක්ෂව 2011 දී සියයට 19.3 ක් දක්වා වර්ධනය විය.

වගකීම් අංශය අනුව බලන විට, පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය වීම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වලින් සමන්විත ආසන්න මුදල්හි වැඩිවීම තුළින් පිළිබිඹු විය. ආසන්න මුදල්හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2010 පැවති සියයට 14.6 ට සාපේක්ෂව 2011 දී සියයට 21.9 ක් ලෙස වාර්තා විය. වසර තුළ දී පුළුල් මුදල් සැපයුමෙහි

**7.3 රූප සටහන** **මුදල් සමස්තයන්හි වර්ධනයන්**



**7.3 සංඛ්‍යා සටහන**

**සංචිත මුදල් සහ පුළුල් මුදල් ($M_{2b}$) සඳහා තුඩුදුන් සාධක (මුදල් සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2010 අවසානයට (අ) | 2011 අවසානයට (ආ) | වෙනස 2010 ප්‍රමාණය | 2010 % | 2011 ප්‍රමාණය | 2011 % |
|---|---|---|---|---|---|---|
| **සංචිත මුදල්** | **360.5** | **439.5** | **57.0** | **18.8** | **79.0** | **21.9** |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 505.5 | 340.1 | 93.3 | 22.6 | -165.4 | -32.7 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | -145.0 | 99.4 | -36.3 | -33.4 | 244.4 | 168.6 |
| **පුළුල් මුදල් ($M_{2b}$)** | **2,091.4** | **2,491.7** | **285.2** | **15.8** | **400.3** | **19.1** |
| ශුද්ධ විදේශීය වත්කම් | 377.4 | 98.1 | -24.4 | -6.1 | -279.4 | -74.0 |
| මූල්‍ය අධිකාරීන් | 505.5 | 340.1 | 93.3 | 22.6 | -165.4 | -32.7 |
| වාණිජ බැංකු | -128.0 | -242.0 | -117.7 | -1,140.2 | -114.0 | -89.1 |
| ශුද්ධ දේශීය වත්කම් | 1,714.0 | 2,393.7 | 309.7 | 22.1 | 679.7 | 39.7 |
| දේශීය ණය | 2,262.9 | 3,038.0 | 355.1 | 18.6 | 775.1 | 34.3 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 627.2 | 833.6 | -13.1 | -2.1 | 206.4 | 32.9 |
| මහ බැංකුව | 76.9 | 262.7 | -32.1 | -29.5 | 185.8 | 241.7 |
| වාණිජ බැංකු | 550.3 | 570.9 | 19.0 | 3.6 | 20.6 | 3.7 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 144.6 | 198.5 | 71.3 | 97.4 | 53.9 | 37.3 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 1,491.1 | 2,005.9 | 296.9 | 24.9 | 514.8 | 34.5 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -548.9 | -644.3 | -45.4 | -9.0 | -95.4 | -17.4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ධනයෙන් සියයට 92 කට පමණ ආසන්න මුදල්හි වැඩිවීම දායකවූ අතර, වසරේ අවසාන කාලය වන විට මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව අඩුවීමත් සමඟ අරමුදල් රැස්කර ගැනීම සඳහා බැංකු විසින් පිරිනමන ලද ඉහළ තැන්පතු පොලී අනුපාතික හේතුවෙන් පොලී උපයන කාලීන තැන්පතු වෙත මහජනතාව යොමු වීම මෙමඟින් පිළිබිඹු වේ. කොටස් වෙළෙඳපොළ මන්දගාමී ක්‍රියාකාරිත්වය ද වාණිජ බැංකුවල ආසන්න මුදල් වැඩිවීමට බලපෑ තවත් හේතුවක් විය හැකිය.

**වත්කම් අංශය අනුව බලන විට, පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි වර්ධනය මුදල් සැපයුමෙහි තීව්‍ර වර්ධනයට මුළුමනින්ම දායක විය.** දේශීය ණය වර්ධනය වීම නිසා වසර තුළ දී බැංකු පද්ධතියෙහි ශුද්ධ දේශීය වත්කම් සියයට 39.7 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුදල් සැපයුමෙහි වර්ධනයට ශුද්ධ දේශීය වත්කම්වල දායකත්වය පෙර වසරේ පැවති සියයට 109 ක පමණ සිට 2011 දී සියයට 170 පමණ දක්වා ඉහළ ගියේය. බැංකු පද්ධතියෙහි ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය සීමා කිරීමට හේතු විය. 2010 අවසානයේ දී රුපියල් බිලියන 377.4 ක් ලෙස පැවති බැංකු පද්ධතියෙහි ශුද්ධ විදේශීය වත්කම්, 2011 තුළ දී සැලකිය යුතු ලෙස රුපියල් බිලියන 98.1 ක් දක්වා අඩුවිය. මහ බැංකුවේ මෙන්ම වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම මෙම පහළ බැසීමට හේතු විය. විනිමය අනුපාතිකය මත ඇතිවන පීඩනය අවම කිරීමට මහ බැංකුව විසින් දේශීය වෙළෙඳපොළට විදේශ විනිමය සැපයීම හේතුකොට ගෙන මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ අතර, වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බැංකු විසින් දේශීය වත්කමක් වන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ආනයන බිල්පත් පියවීමට පහසුකම් සැලසීමය. මීට අමතරව, ඉහළගිය ආනයන මූල්‍යනය කිරීමත් සමඟ විදේශ විනිමය රටින් පිටතට ගලායාමේ ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් තවදුරටත් අඩු විය.

**දේශීය ණය ගැනීම් තුළ, පෞද්ගලික අංශය විසින් ලබාගත් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2010 දෙසැම්බර්හි දී පැවති සියයට 24.9 ට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 34.5 දක්වා වර්ධනය වෙමින් අඛණ්ඩව ඉහළ අගයක පැවතුණි.** ආයෝජන සඳහා පවත්නා හිතකර පරිසරය පිළිබිඹු කරමින් උතුරු සහ නැගෙනහිර පළාත් ඇතුළුව රටෙහි ආර්ථික කටයුතු ඉහළයාම මෙන්ම දේශීය ඉල්ලුම වැඩිවීම ද හේතුකොට ගෙන ණය සඳහා ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි. එසේම, ණය ගැනුම්කරුවෝ දිගින් දිගටම අඩු පොලී අනුපාතික පැවතීම මෙන්ම රටපුරා බැංකු පහසුකම් ව්‍යාප්තවීමත් සමඟ ණය ලබාගැනීමට ඇති හැකියාව පුළුල්වීමේ ප්‍රතිලාභ ලැබූහ. 2010 වසරේ දී පෞද්ගලික අංශය වෙත ලබාදුන් රුපියල් බිලියන 297 ක් වූ ණය ප්‍රමාණයට සාපේක්ෂව මෙම වසර තුළ දී එම ණය රුපියල් බිලියන 515 කින් වර්ධනය විය.

**7.4 රූප සටහන** **වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම්වල ප්‍රමාණය සහ වර්ධනය**




වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, සියලුම ප්‍රධාන කාණ්ඩ යටතේ වූ ණය ලබා දීම් වර්ධනයවී ඇත. කෘෂිකාර්මික සහ ධීවර අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 21.9 ක් ලෙස වාර්තා වූ අතර, කාර්මික සහ සේවා අංශ වෙත ලබා දුන් ණය පිළිවෙළින් සියයට 25.7 කින් සහ සියයට 47.4 කින් වර්ධනය විය. පෞද්ගලික ණය සහ අත්තිකාරම්වල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, පෙර වසරේ පැවති සියයට 33.7 ට සාපේක්ෂව 2011 වසරේ දී සියයට 42.5 ක් ලෙස වාර්තා වූ අතර, පෙර වසරේ සියයට 49.9 ක් ව පැවති උකස් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2011 දෙසැම්බර් වන විට සියයට 69.5 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. වසර තුළ දී රත්රන් මිල ගණන් ඉහළයාම සහ උකස් ව්‍යාපාරයන්හි නියැලී සිටින ආයතන අතර පැවති තරඟකාරිත්වය ඉහළයාම උකස් ණය සැලකිය යුතු ලෙස වර්ධනය වීම තුළින් පිළිබිඹු විය. වසර අවසානය වන විට, සමස්ත නොපියවූ ණයෙහි ප්‍රතිශතයක් ලෙස උකස් ණයෙහි සැලකිය යුතු වර්ධනයක් පැවති අතර, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සහ මූල්‍ය හා ව්‍යාපාරික සේවා වෙත ලබා දුන් ණයෙහි ද වර්ධනයක් දක්නට ලැබුණි. මේ අතර, සමස්ත නොපියවූ ණයෙහි ප්‍රතිශතයක් ලෙස කෘෂිකාර්මික හා ධීවර, ඉදිකිරීම් සහ රෙදිපිළි හා

**7.4 සංඛ්‍යා සටහන** **වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම් වර්ගීකරණය (අ)(ආ)**

රුපියල් බිලියන

| කාණ්ඩය | 2010 අවසානයට (ඇ) | 2011 අවසානයට (ඈ) | එකතුවෙහි ප්‍රතිශතයක් ලෙස 2011 අවසානයට | ප්‍රතිශත වෙනස 2011 |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික සහ ධීවර** | **216.8** | **264.3** | **13.0** | **21.9** |
| එයින්, තේ | 45.5 | 38.5 | 1.9 | -15.3 |
| රබර් | 14.4 | 17.0 | 0.8 | 18.2 |
| පොල් | 4.7 | 4.6 | 0.2 | -2.1 |
| වී | 13.8 | 11.6 | 0.6 | -16.6 |
| එළවළු, පළතුරු සහ සුළු ආහාර බෝග | 6.9 | 8.9 | 0.4 | 30.1 |
| ධීවර | 4.1 | 5.9 | 0.3 | 43.0 |
| **කර්මාන්ත** | **547.3** | **687.7** | **33.9** | **25.7** |
| එයින්, ඉදිකිරීම් | 234.2 | 271.3 | 13.4 | 15.8 |
| ආහාර සහ පාන වර්ග | 31.4 | 42.2 | 2.1 | 34.4 |
| රෙදිපිළි සහ ඇඟළුම් | 85.3 | 98.7 | 4.9 | 15.6 |
| සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 41.8 | 62.6 | 3.1 | 50.0 |
| **සේවා** | **317.6** | **468.0** | **23.1** | **47.4** |
| එයින්, තොග සහ සිල්ලර වෙළෙඳාම | 108.4 | 160.2 | 7.9 | 47.8 |
| සංචාරක ව්‍යාපාරය | 32.4 | 46.6 | 2.3 | 44.0 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 65.8 | 117.2 | 5.8 | 78.1 |
| නාවික, ගුවන් සහ සැපයුම්, සහ භාණ්ඩ නිෂ්කාශනය | 8.9 | 11.4 | 0.6 | 28.4 |
| **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඉ)** | **404.6** | **576.6** | **28.4** | **42.5** |
| එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ | 35.2 | 67.4 | 3.3 | 91.5 |
| උකස් කිරීම් | 166.3 | 281.9 | 13.9 | 69.5 |
| **සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත (උදා: සමෘද්ධි)** | **23.4** | **33.8** | **1.7** | **44.4** |
| **එකතුව** | **1,509.7** | **2,030.4** | **100.0** | **34.5** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අක්වෙරළ බැංකු ඒකක මඟින් ලබා දුන් ණය සහ අත්තිකාරම් ඇතුළත්ය.
(ආ) ණය සහ අත්තිකාරම්වලට අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් ඇතුළත් නොවේ.
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික
(ඉ) 'ඉදිකිරීම්' යටතේ වර්ගීකරණය කර ඇති පෞද්ගලික නිවාස ණය හැර

ඇඟළුම් යන කාණ්ඩයන් වෙත ලබා දුන් ණයෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණි.

කාර්තුමය සමීක්ෂණය මඟින් වාර්තා වන පරිදි ණය සහ අත්තිකාරම්වල මූලික කල්පිරීම අනුව, කෘෂිකාර්මික සහ ධීවර කාණ්ඩය හැර අනෙකුත් අංශ සඳහා පෙර වසරට සාපේක්ෂව 2011 දී මැදිකාලීන සහ දිගුකාලීන ණයෙහි ඉහළ වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික සහ සේවා අංශ තුළ සිදුවූ ඉහළ ප්‍රාග්ධන ආයෝජනයන්, නිවාස ඉදිකිරීම් කටයුතු වැඩිවීම සහ කුටුම්භ විසින් මෝටර් රථ ඇතුළු කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ මිල දී ගැනීම ඉහළයාම, මැදිකාලීන හා දිගුකාලීන ණයෙහි ඉහළ වර්ධනයට හේතු විය හැක. කෙසේ වුවද, සියලුම කාණ්ඩයන්හි නොපියවූ ණයෙන් විශාල ප්‍රමාණයක් තවදුරටත් කෙටිකාලීන ණය වශයෙන් පවතී.

රාජ්‍ය අයවැයෙහි 2011 වසර සඳහා ඇස්තමේන්තුගත අගය වූ රුපියල් බිලියන 42 ඉක්මවමින් වසර තුළ දී රජය වෙත ලබාදුන් ණය රුපියල් බිලියන 206 කින් වර්ධනය විය. වසර තුළ දී මහ බැංකුව වෙතැති රජයේ සුරැකුම්පත් රුපියල් බිලියන 167.7 කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, 2011 වසරේ දී රජය වෙත ලබා දුන් තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 16.9 කින් වර්ධනය විය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සහ රජයේ සුරැකුම්පත්වල සිදුකරන ලද ඉහළ ආයෝජන හේතුවෙන් වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ද වර්ධනය විය.

**7.5 රූප සටහන** — **වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම්වල වර්ගීකරණය**




2010 අවසානය වන විට රුපියල් බිලියන 145 ක් වූ රාජ්‍ය සංස්ථා වෙත ලබා දුන් ණය, 2011 තුළ දී රුපියල් බිලියන 54 කින් පමණ වර්ධනය විය. වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම දායක වූ අතර, එම ණය මුදල් වලින් වැඩි ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ආනයන බිල්පත් පියවීම සඳහා යොදා ගන්නා ලදී.

**7.5 සංඛ්‍යා සටහන** — **වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් නොපියවූ ණයෙහි පරිණත කාල පිළිබඳ විශ්ලේෂණය**

| | | දෙසැම්බර් 2010 | | දෙසැම්බර් 2011 | |
|---|---|---|---|---|---|
| | | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් % | වර්ධනය % | එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් % | වර්ධනය % |
| කෘෂිකාර්මික සහ ධීවර | කෙටිකාලීන | 10.3 | 31.7 | 10.3 | 33.6 |
| | මැදිකාලීන | 2.7 | 92.2 | 1.8 | -7.8 |
| | දිගුකාලීන | 1.3 | 39.6 | 0.9 | -8.8 |
| කර්මාන්ත | කෙටිකාලීන | 14.6 | 21.3 | 13.3 | 22.7 |
| | මැදිකාලීන | 7.9 | 5.8 | 8.0 | 35.8 |
| | දිගුකාලීන | 13.7 | 4.4 | 12.5 | 22.9 |
| සේවා | කෙටිකාලීන | 10.5 | 41.8 | 10.7 | 36.3 |
| | මැදිකාලීන | 6.0 | 34.1 | 7.4 | 65.1 |
| | දිගුකාලීන | 4.5 | 9.2 | 5.0 | 49.4 |
| පෞද්ගලික ණය සහ අත්තිකාරම් | කෙටිකාලීන | 18.1 | 49.7 | 19.8 | 46.6 |
| | මැදිකාලීන | 5.4 | 35.9 | 4.9 | 20.8 |
| | දිගුකාලීන | 3.3 | -17.4 | 3.8 | 55.8 |
| සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත (උදා: සමෘද්ධි) | කෙටිකාලීන | 0.8 | 29.6 | 0.3 | -52.4 |
| | මැදිකාලීන | 0.4 | 25.9 | 0.4 | 16.2 |
| | දිගුකාලීන | 0.4 | 204.9 | 1.0 | 293.2 |

සටහන: මූලික කල්පිරීම පදනම් කරගනිමින් ණය වර්ගීකරණය සිදුකර ඇති අතර එය වසර 1 ට අඩු - කෙටිකාලීන, වසර 1-5 අතර - මැදිකාලීන හා වසර 5 ට වැඩි - දිගුකාලීන වශයෙන් දක්වා ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.6 සංඛ්‍යා සටහන**

**පුළුල් මුදල් ($M_4$) සඳහා තුඩුදුන් සාධක**
**(මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2010 අවසානයට (අ) | 2011 අවසානයට (ආ) | වෙනස | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2010 | | 2011 | |
| | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| පුළුල් මුදල් ($M_4$) | **2,636.0** | **3,135.8** | **356.1** | **15.6** | **499.8** | **19.0** |
| තුඩුදුන් සාධක | | | | | | |
| ශුද්ධ විදේශීය වත්කම් | 354.5 | 92.4 | -23.6 | -6.2 | -262.1 | -73.9 |
| ශුද්ධ දේශීය වත්කම් | 2,281.5 | 3,043.4 | 379.7 | 20.0 | 761.9 | 33.4 |
| දේශීය ණය | 2,973.9 | 3,940.7 | 460.0 | 18.3 | 966.8 | 32.5 |
| රජයේ ශුද්ධ ණය ගැනීම් | 932.4 | 1,154.6 | 20.9 | 2.3 | 222.2 | 23.8 |
| රාජ්‍ය සංස්ථාවලට දුන් ණය | 144.6 | 198.5 | 71.3 | 97.4 | 53.9 | 37.3 |
| පෞද්ගලික අංශයට දුන් ණය | 1,896.9 | 2,587.6 | 367.8 | 24.1 | 690.6 | 36.4 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -692.4 | -897.3 | -80.3 | -13.1 | -204.9 | 29.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## පුළුල් මුදල් සැපයුම ($M_4$)[2]

වසර තුළ දී මූල්‍ය සමීක්ෂණය අනුව මනිනු ලබන පුළුල් මුදල් සැපයුමෙහි ($M_4$) වැඩිවීම, මුදල් සමීක්ෂණය අනුව මනිනු ලබන පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$) දක්නට ලැබුණු වර්ධන ප්‍රවණතාවට අනුරූපී විය. මෙම පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2010 දෙසැම්බර් පැවති සියයට 15.6 සිට 2011 අවසානය වන විට සියයට 19 ක් දක්වා ඉහළ ගියේය. අදාළ කාලසීමාව තුළ දී ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ බැවින් මෙම වර්ධනය මුළුමනින්ම ශුද්ධ දේශීය වත්කම් වැඩිවීම හේතුකොට ගෙන සිදු විය. නිරපේක්ෂ අගය අනුව, 2011 වසර තුළ දී ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 761.9 කින් වර්ධනය වූ අතර, ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 262.1 කින් අඩු විය. පුළුල් මුදල් සැපයුමෙහි ශුද්ධ විදේශීය වත්කම්වල අඩුවීමට මහ බැංකුවේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් අඩුවීම හේතු වුවද, වසර තුළ දී බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 17.3 කින් පමණ ඉහළ ගියේය. ශුද්ධ දේශීය වත්කම් සම්බන්ධයෙන් සලකන විට පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය වෙත ලබාදුන් ණය 2011 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පෙර වසරේ වාර්තා වූ සියයට 24.1 ක වර්ධනයට සාපේක්ෂව 2011 වසරේ දී සියයට 36.4 කින් වර්ධනය විය. රජය වෙත ලබාදුන් ශුද්ධ ණය 2010 වසරේ වූ රුපියල් බිලියන 20.9 ක වර්ධනයට සාපේක්ෂව 2011 දී රුපියල් බිලියන 222.2 කින් ඉහළ ගියේය.

**මූල්‍ය සමීක්ෂණයට අනුව, කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වලින් සමන්විත ආසන්න මුදල්හි වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2010 අවසානයේ දී පැවති සියයට 15 සිට 2011 අවසානය වන විට සියයට 20.9 ක් දක්වා ඉහළ ගියේය.** බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල ආසන්න මුදල්හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2010 දෙසැම්බර් අවසානයේ පැවති සියයට 22 ට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 27.3 ක් විය. කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් ලබා දුන් ඉහළ පොලී අනුපාතික, එම මූල්‍ය සමාගම්වල මූල්‍ය තත්ත්වය වැඩිදියුණු වීම සහ බොහෝ මූල්‍ය සමාගම් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වීම ඔවුන් වෙතැති තැන්පතු වර්ධනය වීමට හේතු විය. මේ අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ආසන්න මුදල්හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය ද 2010 වසරේ දී පැවති සියයට 13.5 සිට 2011 අවසානයේ දී සියයට 17.5 ක් දක්වා ඉහළ යන ලදී.

**මූල්‍ය සමීක්ෂණයට ($M_4$) අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ගණනය කරනු ලැබූ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් ලබා දුන් ණය ඉහළයාම හේතුවෙන් 2011 අවසානය වන විට මුදල් සමීක්ෂණයට ($M_{2b}$) අනුව පැවති සියයට 34.5 ක වර්ධනයට සාපේක්ෂව සියයට 36.4 කින් වර්ධනය විය.** විශේෂයෙන්ම කල්බදු මූල්‍යකරණය සහ උකස් ණය ඉහළ යාම හේතුවෙන් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2010 වසරේ පැවති සියයට 38.9 ක වර්ධනයට සාපේක්ෂව 2011 අවසානය වන විට රුපියල් බිලියන 110.9 ක් දක්වා

[2] මූල්‍ය සමීක්ෂණය ($M_4$) ද්‍රවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර, එයට මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ද ඇතුලත් වේ. එසේ වුවද, ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති කටයුතු සඳහා පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) භාවිතා කරනු ලැබේ.

සියයට 67.5 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.[3] බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2010 අවසානයේ දී වාර්තා කළ සියයට 11.5 ක වර්ධනයට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 26.9 කින් වර්ධනය විය.

**ප්‍රධාන වශයෙන්ම මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ණය ඉහළ යාම නිසා මුදල් සමීක්ෂණය ($M_{2b}$) හි රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වර්ධනය වූ අතර 2011 තුළ දී බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් රජය වෙත ලබාදුන් ණය ද ඉහළ යන ලදී.** එම නිසා 2011 වසර තුළ දී රජයට ලබාදුන් ශුද්ධ ණයෙහි වැඩිවීම, මුදල් සමීක්ෂණයට ($M_{2b}$) අනුව රුපියල් බිලියන 206.4 ක් වුවද, මූල්‍ය සමීක්ෂණයට ($M_4$) අනුව එය රුපියල් බිලියන 222.2 ක පමණ වැඩි අගයක් ගත්තේය.

## 7.4 පොලී අනුපාතික

**2011 ජනවාරි මාසයේ දී පහත හෙළන ලද මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉන්පසුව වසර තුළ දී නොවෙනස්ව පැවතුණි.** ආයෝජන සඳහා තවදුරටත් පහසුකම් සැලසීමටත් ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමටත් 2011 ජනවාරි මාසයේ දී ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් පදනම් අංක 25 කින් සහ පදනම් අංක 50 කින් අඩු කරන ලද අතර, ඉන්පසුව එම අනුපාතික පිළිවෙළින් සියයට 7.00 සහ සියයට 8.50 ලෙස පැවතුණි. මේ අතර, 2011 වසරේ දී බැංකු අනුපාතිකය සියයට 15.00 ක් ලෙස තවදුරටත් නොවෙනස්ව පැවතුණි. 2011 ප්‍රථම කාර්තු තුන තුළ දී රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඇතුළු වෙළෙඳපොළ පොලී අනුපාතික බොහෝ දුරට ස්ථායීව පැවතුණි. කෙසේ වුවද, දේශීය මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අඩු වීමත් සමඟ 2011 සිව්වන කාර්තුවේ දී වෙළෙඳපොළ පොලී අනුපාතික සහ රාජ්‍ය සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල ඉහළයාමක් දක්නට ලැබුණි. මේ අතර, 2012 පෙබරවාරි මාසයේ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් ඉහළ දැමූ අතර, ඒ අනුව ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙළින් සියයට 7.50 සහ සියයට 9.00 වශයෙන් දැනට පවතියි.

### මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික

**2011 වසර තුළ දී අන්තර් බැංකු වෙළෙඳපොළෙහි බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීම තුළින් වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන්හි වෙනස්වීම් පිළිබිඹු විය.** වසරේ ප්‍රථම කාර්තු තුනෙහි වැඩි කාලයක් තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යයට ආසන්නව සියයට 7.75 ක් ලෙස පැවතුණු නමුත්, අවසාන කාර්තුව තුළ දී මුදල් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව පහළ බැසීමත් සමඟ එහි ඉහළයාමක් පෙන්නුම් කළේය. පොලී අනුපාතිකයන්හි විචලනය අඩු කිරීම සඳහා මහ බැංකුව විසින් 2011 සැප්තැම්බර් 19 වැනි දින සිට විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි නැවත ආරම්භ කරන ලද අතර, මේ වෙන්දේසිවලදී බරිත සාමාන්‍ය ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි අනුපාතිකය සියයට 7.08 ක් ලෙස වාර්තා විය. වෙළෙඳපොළ තුළ සමස්තයක් වශයෙන් අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතුණද ඔක්තෝබර් මුල දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි යම් විචලනයක් පෙන්නුම් කරන ලද අතර, ඒ හේතුවෙන් 2011 ඔක්තෝබර් 05-14 කාලය තුළ දී දෛනික ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීමට මහ බැංකුවට සිදුවිය. මින්පසුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 8.05 ක පමණ මට්ටමේ ස්ථායීව පැවතුණු නමුත්, ද්‍රවශීලතාව තවදුරටත් පහත වැටීම සහ ඇතැම් බැංකු නිත්‍ය පහසුකම යටතේ ප්‍රතිවිකුණුම් පහසුකම ලබාගැනීමත් සමඟ නොවැම්බර් අවසානයේ සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව ඉක්මවා ඉහළ ගියේය. දෙසැම්බර් මස දෙවන භාගය තුළ දී මහ බැංකුව විසින් නොකඩවාම දෛනික ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වුවද බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි යම් විචලනයක් දක්නට ලැබුණි. මෙම ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල දී බරිත සාමාන්‍ය වෙන්දේසි අනුපාතිකය සියයට 7.25-8.25 ත් අතර උච්චාවචනය විය. මේ අතර බදු ගලපන ලද බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය වසර මුළුල්ලේම බොහෝදුරට ප්‍රතිපත්ති පොලී

**7.6 රූප සටහන** **තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික**




[3] 2011 දෙසැම්බර් මාසයේ දී දැනටමත් ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින විශේෂිත කල්බදු සමාගමක් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් බලපත්‍රය ලබාගැනීම, 2011 දෙසැම්බර් මාසයේ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම විසින් පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි තියුණු වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**7.7 සංඛ්‍යා සටහන** **තෝරාගත් මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික**

වාර්ෂික පොලිය සියයට

| කාලපරිච්ඡේදය | බරිත සාමාන්‍ය ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි අනුපාතිකය | බරිත සාමාන්‍ය ප්‍රතිවිකුණුම් වෙන්දේසි අනුපාතිකය | බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | | ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (එක් දින) | |
|---|---|---|---|---|---|---|
| | කාලපරිච්ඡේදය අග | කාලපරිච්ඡේදය අග | කාලපරිච්ඡේදය අග | මාසික සාමාන්‍යය | කාලපරිච්ඡේදය අග | මාසික සාමාන්‍යය |
| දෙසැ-09 | 8.24 | - | 9.07 | 9.00 | 9.03 | 9.10 |
| දෙසැ-10 | - | - | 8.03 | 8.13 | 8.15 | 8.17 |
| මාර්-11 | - | - | 7.62 | 7.72 | 7.88 | 7.88 |
| ජූනි-11 | - | - | 8.00 | 7.94 | 7.99 | 7.95 |
| සැප්-11 | 7.08 | - | 8.05 | 8.02 | 8.05 | 8.03 |
| දෙසැ-11 | - | 8.07 | 8.97 | 8.69 | 9.01 | 8.77 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතික කොරිඩෝව තුළ පැවතුණ නමුත් වසර තුළ දී එය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාවේ සිට ඉහළ සීමාව දක්වා ඉහළ නැගුණි. මේ අතර, තෝරාගත් වාණිජ බැංකු 12 ක අන්තර් බැංකු රුපියල් ගනුදෙනුවල අර්පණ අනුපාතිකයන්ගේ සාමාන්‍ය අගය ලෙස ගණනය කරනු ලැබූ එක් දින ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය 2011 දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය හා සමාන හැසිරීමක් පෙන්නුම් කළ අතර, එක් දින සහ මාස 12 කාලයක් සඳහා වූ ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතික අතර වෙනස අනාගතයේ දී ඉහළ පොලී අනුපාතික පිළිබඳ වෙළෙඳපොළ අපේක්ෂාවන් පෙන්නුම් කරමින්, සැප්තැම්බර් මස පැවති පදනම් අංක 40-50 පමණ මට්ටමේ සිට වසරේ අවසාන සති හය තුළ දී පදනම් අංක 110-170 ක් අතර මට්ටම දක්වා පුළුල් විය.

## තැන්පතු සහ ණය පොලී අනුපාතික

තැන්පතු පොලී අනුපාතික වසරේ ප්‍රථම කාර්තු තුන තුළ දී සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවති නමුත් 2011 සිව්වන කාර්තුවේ දී ඉහළ ගියේය. 2010 දෙසැම්බර් මාසයේ දී සියයට 6.23 ක් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම පොලී උපයන තැන්පතු පදනම් කොටගෙන මාසිකව ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය වසරේ ප්‍රථම මාස හතර තුළ දී බොහෝදුරට ස්ථායීව පැවතුණි. ඉන්පසුව එම අනුපාතිකය ක්‍රමයෙන් ඉහළ ගිය අතර, වසර තුළ දී පදනම් අංක 101 ක වැඩිවීමක් වාර්තා කරමින් 2011 දෙසැම්බර් වන විට සියයට 7.24 ක් බවට පත්විය. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම කාලීන තැන්පතු පදනම් කරගත් බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය, ජනවාරි සිට නොවැම්බර් කාලපරිච්ඡේදය තුළ සියයට 8.11-8.24 ක පරාසය තුළ පැවැති අතර 2011 දෙසැම්බර් මාසයේ දී සියයට 8.95 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වසරේ අවසාන මාසවල දී තැන්පතු අනුපාතික ඉහළ යාම විශේෂයෙන්ම දේශීය මුදල් වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව පහත බැසීමත් සමග කෙටිකාලීන තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා පැවති තරගකාරිත්වය ඉහළයාමේ ප්‍රතිඵලයක් විය. මේ අතර, වසර තුළ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතුරුම් අනුපාතික නොවෙනස්ව පැවැතුණි. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් කාලීන තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික, දින 30 තැන්පතු සඳහා 2010 අවසානයේ දී පැවති සියයට 8.79-10.50 ක පරාසයක සිට 2011 අවසානය වන විට සියයට 8.82-10.74 ක පරාසයක් දක්වා ඉහළ ගිය නමුත්, මාස 12 තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2010 අවසානයේ පැවති සියයට 10.84-13.08 පරාසයට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 10.72-12.74 ක පරාසය තුළ පැවතුණි.

**සෑම වසරකම අවසානයේ දී මුදල් මණ්ඩලය විසින් තීරණය කොට රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන නෛතික පොලී අනුපාතිකය සහ වෙළෙඳපොළ**

**7.8 සංඛ්‍යා සටහන** **තැන්පතු සහ ණය පොලී අනුපාතික (අ)**

වාර්ෂික පොලිය සියයට

| ආයතනය | 2010 අවසානයට | 2011 අවසානයට |
|---|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | | |
| *තැන්පතු පොලී අනුපාතික* | | |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 5.05-17.00 (ආ) | 5.55-11.00 |
| ඉතිරිකිරීමේ තැන්පතු | 1.50-9.50 | 1.00-8.50 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 6.23 | 7.24 |
| බරිත සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතිකය | 8.20 | 8.95 |
| *ණය පොලී අනුපාතික* | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය | 9.27 | 10.49 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය | 14.80 | 13.44 |
| අනෙකුත් මූල්‍ය ආයතන | | |
| *තැන්පතු පොලී අනුපාතික* | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.00 | 5.00 |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 8.50 | 8.50 |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | | |
| ඉතිරි කිරීමේ තැන්පතු | 6.37-8.25 | 6.16-7.50 |
| එක් අවුරුදු ස්ථිර තැන්පතු | 10.84-13.08 | 10.72-12.74 |
| *ණය පොලී අනුපාතික* | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | |
| නිවාස ණය | 11.00-14.00 | 10.00-12.50 |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | | |
| මූල්‍ය කල්බදු | 10.44-21.40 | 9.58-22.02 |
| කුලීපිට ගැනුම් | 12.59-20.74 | 11.42-19.74 |
| නිශ්චල දේපල මත ලබා දුන් ණය | 14.50-21.55 | 14.89-19.47 |

(අ) වාණිජ බැංකු සහ තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ආ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**පොලී අනුපාතිකය 2011 වසර සඳහා වූ සියයට 7.26 ට සාපේක්ෂව 2012 වසර සඳහා සියයට 6.48 ක් විය.**[4] ඉකුත් මාස දොළහ තුළ දී සියලු වාණිජ බැංකුවල පවත්වා ගෙනයනු ලැබූ සියලුම පොලී උපයන රුපියල් තැන්පතු සඳහා අදාළ වන බරිත සාමාන්‍ය පොලී අනුපාතික පදනම් කර ගනිමින් සෑම වසරකම දෙසැම්බර් මාසයේ දී මෙම අනුපාතිකය ගණනය කරනු ලැබේ.

**අනෙකුත් පොලී අනුපාතික හා සමගාමීව ණය පොලී අනුපාතික ද 2011 අවසාන කාර්තුව තුළ දී ඉහළ යාමට පෙර මුල් කාර්තු තුන තුළ දී බොහෝදුරට ස්ථායීව පැවතුණි.** වසර තුළ දී වාණිජ බැංකු විසින් තම ප්‍රමුඛ ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන ණය පොලී අනුපාතික පදනම් කර සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය නොවැම්බර් මුල් කාලය වන තුරු සියයට 8.92-9.96 ක පරාසය තුළ පැවතුණ ද වසරේ අවසාන සතියේ දී සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් සියයට 10.77 ක් විය. වසර තුළ දී බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකයෙහි වැඩිවීම පදනම් අංක 148 ක් විය. කෙසේ වුවද, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දී ඇති සියලු ණය සහ අත්තිකාරම්වලට අදාළ වන පොලී අනුපාතිකයන්ගේ වෙනස්වීම පිළිබිඹු කරන බරිත සාමාන්‍ය ණය අනුපාතිකය, 2011 වසරේ දී අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාණිජ බැංකු විසින් පෙර වසරවල දී ලබා දුන් ණය සඳහා අය කරනු ලැබූ ඉහළ පොලී අනුපාතික වසර තුළ දී ක්‍රමයෙන් පහළ යාම සහ 2011 වසර තුළ දී අඩු පොලී අනුපාතිකවලට ලබා දුන් ණය ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් වැඩි වීමය. ඒ අනුව, බරිත සාමාන්‍ය ණය අනුපාතිකය 2010 අවසානයේ දී පැවති සියයට 14.80 සිට 2011 දෙසැම්බර් වන විට සියයට 13.44 දක්වා පදනම් අංක 136 කින් පහළ වැටුණි.[5] පෞද්ගලික ඇපවීම් හා පොරොන්දු නෝට්ටු සහ කොටස්, බැඳුම්කර, ණයකර මෙන්ම ජීවිත රක්ෂණ ඔප්පුවල මූල්‍ය වටිනාකම ඇතුළු ණය සුරැකුම් වර්ග මත ලබා දී ඇති ණය හැරුණුකොට අනෙකුත් සියලු සුරැකුම් වර්ග යටතේ ලබා දී ඇති ණයෙහි බරිත සාමාන්‍ය ණය අනුපාතිකයන් 2011 වසර තුළ දී සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කළේය.

[4] නෛතික පොලී අනුපාතිකය 1990 අංක 6 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයක දී අදාළ වේ. වෙළෙඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතනයන් විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ රුපියල් 150,000 කට වඩා වැඩි වූ ණයක් අය කර ගැනීමේ දී ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයන් නොමැති විටක වෙළෙඳපොළ පොලී අනුපාතිකය අදාළ වේ.

[5] සැලකිය යුතු කරුණක් වන්නේ 2010 අවසානය වන තෙක් කාර්තුමය වශයෙන් ගණනය කරන ලද බරිත සාමාන්‍ය ණය අනුපාතිකය, 2011 ජනවාරි මාසයේ සිට මාසිකව ඉදිරිපත් කරනු ලැබීමය.

**7.7 රූප සටහන** **සුරැකුම් වර්ගය අනුව වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (සියයට)**




**2011 වසර තුළ දී ප්‍රධාන ආර්ථිකයන්හි පොලී අනුපාතික තවදුරටත් අඩු සහ ස්ථායී මට්ටමක පැවතීම නිසා වාණිජ බැංකු විසින් දේශීයව පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික ද බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි.** එ.ජ.ඩොලර් වලින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතික 2010 අවසානයේ පැවති සියයට 0.015-2.66 ක පරාසයට සාපේක්ෂව 2011 අවසානය වන විට සියයට 0.015-2.79 ක පරාසයක් තුළ පැවතුනු අතර, එ.ජ.ඩොලර් වලින් පවත්වාගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික 2011 වසර තුළ දී ද සියයට 0.10-5.61 පරාසය තුළ බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. ස්ටර්ලින් පවුම්වලින් පවත්වාගෙන යනු ලබන ඉතිරිකිරීම් තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික 2010 අවසානය වන විට පැවති සියයට 0.10-3.50 ක පරාසය තුළම 2011 අවසානය වන විටද නොවෙනස්ව පැවතුණු අතර, ස්ටර්ලින් පවුම්වලින් පවත්වාගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික 2010 දී දක්නට ලැබුණු සියයට 0.375-6.40 ක පරාසයට සාපේක්ෂව 2011 තුළ දී සියයට 0.375-6.24 ක පරාසයක පැවතුණි.

### රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

**වෙළෙඳපොළ ද්‍රවශීලතාව හිඟවීමත් සමග වසර අවසානය වන විට ප්‍රාථමික වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යන ලද අතර, 2011 වසර තුළ දී වසර 15 ක් දක්වා පරිණත කාලයන්ගෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී.** ජනවාරි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පහත දැමීමේ සිට සැප්තැම්බර් අවසානය දක්වා කාලසීමාව තුළ

පැවති වෙන්දේසිවල දී භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතික පුළුල් වශයෙන් ස්ථායී මට්ටමක පැවතුණි. කෙසේ වුවත්, 2011 ඔක්තෝබර් මස සිට ද්‍රවශීලතාව අඩුවීමත් සමඟ ඵලදා අනුපාතික ඉහළ යාම සිදුවිය. ඒ අනුව දින 91, දින 182 සහ දින 364 යන පරිණත කාලවලින් සමන්විත භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික වසර තුළ දී පිළිවෙළින් පදනම් අංක 144, 136 සහ 176 කින් ඉහළ ගියේය. ප්‍රාථමික වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ඵලදා අනුපාතික වෙනස්වීම සැලකූ විට, වසර දෙකක පරිණත කාලයකින් සමන්විත බැඳුම්කර සඳහා සියයට 7.77 ක සිට වසර 15 ක් වැනි දීර්ඝ පරිණත කාලයකින් සමන්විත බැඳුම්කර සඳහා සියයට 9.30 ක් වැනි පරාසයක් තුළ පැවතුණි.

**රජයේ සුරැකුම්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය ඉහළට විතැන් වූ නමුත් පෙර වසරට සාපේක්ෂව 2011 වසර අවසානය වන විට වඩාත් පැතලි ස්වරූපයකින් යුක්ත විය.** අනෙකුත් පොලී අනුපාතිකවලට අනුරූපීව භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර යන දෙකෙහිම ඵලදා අනුපාතික වසරේ පළමු මාස නවය තුළ දී ස්ථායීව පැවතුණු අතර, වසරේ අවසාන මාස තුන තුළ දී ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාලසීමා තුනටම අදාළ ඵලදා අනුපාතික 2011 සැප්තැම්බර් මස දක්වා සියයට 6.98-7.36 ක පරාසයක පැවති අතර, 2011 දෙසැම්බර් අවසානය වන විට සියයට 8.60-9.25 ක පරාසයක් දක්වා ඉහළ යන ලදී. මේ අතර, අවුරුදු 2-15 දක්වා වූ පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළෙඳපොළ ඵලදා අනුපාතික වසරේ මුල් මාස නවය තුළ දී සියයට 7.33-9.40 ක පරාසයක පැවති අතර එය ද 2011 අවසානය වන විට සියයට 9.45-9.95 ක පරාසයක් දක්වා ඉහළ ගියේය.

**7.8 රූප සටහන** රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ ඵලදා වක්‍රය




**7.9 සංඛ්‍යා සටහන** රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

වාර්ෂික පොලිය සියයට

| උපකරණය | 2010 අවසානයට | 2011 අවසානයට |
|---|---|---|
| ප්‍රාථමික වෙළෙඳපොළ | | |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| දින 91 | 7.24 | 8.68 |
| දින 182 | 7.35 | 8.71 |
| දින 364 | 7.55 | 9.31 |
| භාණ්ඩාගාර බැඳුම්කර (අ) | | |
| වසර 2 | 8.27 (ආ) | 7.77 (ඇ) |
| වසර 3 | 8.15 | 7.99 (ඈ) |
| වසර 4 | 8.60 | 8.30 (ඉ) |
| ද්විතීයික වෙළෙඳපොළ | | |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| දින 91 | 7.26 | 8.60 |
| දින 182 | 7.36 | 8.78 |
| දින 364 | 7.55 | 9.25 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| වසර 2 | 7.65 | 9.45 |
| වසර 3 | 8.03 | 9.85 |
| වසර 4 | 8.78 | 9.92 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) බැඳුම්කරයෙහි පරිණත කාලය වඩාත් ආසන්න පරිණත කාලය මත
(ආ) වසර 2 ක පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන අවසාන වෙන්දේසිය පවත්වන ලද්දේ 2010 අගෝස්තු මසදීය.
(ඇ) වසර 2 ක පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන අවසාන වෙන්දේසිය පවත්වන ලද්දේ 2011 පෙබරවාරි මසදීය.
(ඈ) වසර 3 ක පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන අවසාන වෙන්දේසිය පවත්වන ලද්දේ 2011 ජනවාරි මසදීය.
(ඉ) වසර 4 ක පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන අවසාන වෙන්දේසිය පවත්වන ලද්දේ 2011 ජූනි මසදීය.

## සාංගමික ණය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

2011 වසරේ දී වෙළෙඳපොළ අනෙකුත් පොලී අනුපාතිකයන්ට අනුරූපී හැසිරීමක් සාංගමික ණය සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල ද දක්නට ලැබුණි. ඒ අනුව සාංගමික ණය සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද වසරේ පළමු කාර්තු 3 තුළ දී බොහෝදුරට ස්ථායීව පැවතිය ද අවසාන කාර්තුවේ දී ඉහළ නැගීමක් පෙන්නුම් කරන ලදී. 2011 වසර තුළ දී කෙටිකාලීන ණය උපකරණයක් වන වාණිජ පත්‍රිකා සඳහා වන පොලී අනුපාතික සියයට 8.26-14.00 ක පරාසයක් තුළ පැවතුණි. 2011 වසර තුළ දී පරිණත කාලය වසර 3-10 අතර වන නව සාංගමික ණයකර ලැයිස්තුගත වීම් පහක් පැවති අතර එම ණයකර සඳහා ගෙවන පොලී අනුපාතික සියයට 11.50-13.00 ක පරාසයක් තුළ පැවතුණි.

**විශේෂ සටහන 13**

## වත්කම් මිල බුබුළු සහ මුදල් ප්‍රතිපත්තිය

මහ බැංකු කටයුතු පිළිබඳව වර්තමානයේ පවතින ප්‍රධාන විවාදයක් වන්නේ වත්කම් මිල බුබුළුවලට[1] මුදල් ප්‍රතිපත්තිය මගින් ප්‍රතිචාර දැක්විය යුතු ද යන්නයි. වත්කම් මිල බුබුළු සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග භාවිතා කිරීම පිළිබඳ තවත් කරුණක් වන්නේ මහ බැංකුවල ප්‍රධාන පරමාර්ථ වන උද්ධමනය හා ආර්ථිකය ස්ථායි මට්ටමෙන් පවත්වාගෙන යාමෙන් ඔබ්බට ගොස් වත්කම් බුබුළුවලට ප්‍රතිචාර දැක්වීම සඳහා මුදල් ප්‍රතිපත්තිය යොදා ගත යුතු ද යන්නයි. මෙම පසුබිම තුළ, වත්කම් මිල බුබුළු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රවේශයන් දෙකක් වර්තමානයේ මහ බැංකු කටයුතු සම්බන්ධ විවාදවලදී මූලික වේ. එම ප්‍රවේශ දෙක නම්, වත්කම් මිල බුබුළු ඇතිවීම වළක්වා ගැනීමට ක්‍රියා කිරීම හා වත්කම් මිල බුබුළු පිපිරීමෙන් පසුව ඇතිවන සාර්ව ආර්ථික ප්‍රතිවිපාකවලට පිළියම් යෙදීමයි.

වත්කම් මිල බුබුළු පිළිබඳ විවාදය විශාල ලෙස පිළිබිඹු වූ ආසන්නතම සිදුවීම වන්නේ 2008-09 කාලයේ දී ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදයයි. ගෝලීය මූල්‍ය අර්බුදය ඇති වීමට පෙර, ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාසවල මිල ගණන් මූලිකව පැවතිය යුතු අගයට වඩා විශාල ලෙස වැඩිවීමක් දක්නට ලැබුණි. මෙසේ බොහෝ කාලයක් තිස්සේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාසවල පැවති ඉහළ මිල ගණන් තියුණු ලෙස අඩුවීම මෙම අර්බුදයට සැලකිය යුතු ලෙස දායක වූ සාධකවලින් එකක් විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ නිවාසවල ඉහළ මිල ගණන් පැවති කාල සීමාව සහ ඊට පසු ඇති වූ ආර්ථික පිරිහීම, 1985-92 කාලය තුළ ජපානය මුහුණ දුන් වත්කම් මිල උත්පාත සහ අවපාත චක්‍රය හා සැසඳීමෙන් සාකච්ඡා කළ හැක. 1960 සිට වසර 30 ක කාලයක් තුළ ජපානයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය වසරකට සාමාන්‍යයෙන් සියයට 6 කට වඩා වැඩි අනුපාතයකින් වර්ධනය විය. මෙමගින් ජපානයේ වාණිජමය දේපොළ සහ ව්‍යාපාර කොටස් සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවිය. කොටස් වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. මුදල් ප්‍රතිපත්තිය යම්තාක් දුරට පැවති තත්ත්වයට උපකාරී වූ අතර, පුළුල් මුදල් සැපයුම අංක දෙකකින් යුත් වර්ධන අනුපාතවලින් ඉහළ ගියේය. මෙම මුදල් ප්‍රසාරණය හේතුවෙන් පොලී අනුපාතික අඩු වූ අතර, වත්කම් මිල ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, 1990 වසරේදී වත්කම්වල මිල අඩු වීම ආරම්භ විය. 1990 වසර ආරම්භයේ පැවති කොටස් වෙළෙඳපොළ මිල මට්ටම වසර තුළදී ඉන් අඩක් දක්වා පහත වැටුණි. මෙම වත්කම් මිල පහළ යාම ආර්ථිකයේ අනෙකුත් අංශවලට ද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ අතර, 1992-93 කාලපරිච්ඡේදය තුළ ආර්ථික වර්ධනය සියයට 1 කට වඩා අඩු අගයක් දක්වා ශීඝ්‍රයෙන් පහත වැටුණි. 2007-09 කාලපරිච්ඡේදයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ ද මෙවැනිම තත්ත්වයක් දක්නට ලැබුණි. මෙම අවස්ථා දෙකෙහිදීම, වත්කම් මිල අධික ලෙස ඉහළ යාමටත් ඉන් පසුව අධික ලෙස පහළ යාමටත් ඒ සමග අනපේක්ෂිත ලෙස ධනය අඩුවීම, අක්‍රීය ණය ශීඝ්‍ර ලෙස ඉහළ යාම, බැංකු සහ මූල්‍ය අංශයෙහි අර්බුද මෙන්ම සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ අශුභවාදී දැක්මක් ව්‍යාප්ත වීම ද දක්නට ලැබිණි. ජපානයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් දැක්වූ ප්‍රතිචාර සමාන වූ අතර, ඒ අනුව, රාජ්‍ය වියදම් ඉහළ යෑම, විශාල අයවැය හිඟය සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණයෙහි ශීඝ්‍ර ඉහළ යෑමක් ද සිදු විය. කෙසේ වුවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ සංචිත බැංකුව එරට බැංකු පද්ධතියට විශාල වශයෙන් අරමුදල් සැපයූ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික ද අඛණ්ඩව පහත දැමීය. එපමණක් නොව වැදගත් විය හැකි වෙනත් වෙනස්කම් ද මේ රටවල් අතර දක්නට ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ආර්ථිකය හා ශ්‍රම වෙළෙඳපොළ ජපානයට වඩා නම්‍යශීලී වේ. උදාහරණයක් ලෙස සැලකූ විට, 2007-09 කාලපරිච්ඡේදය තුළ ඇමෙරිකා එක්සත් ජනපදයේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ ගිය අතර, ශ්‍රම වෙළෙඳපොළෙහි ස්වභාවය හේතුවෙන් මිල බුබුළු පිපිරීමෙන් පසුව වුවද සේවා වියුක්තියේ සැලකිය යුතු වෙනසක් ජපාන ආර්ථිකයේ දක්නට නොලැබිණි. මෙම අවස්ථා දෙකෙහිදීම ආර්ථිකය යළි නඟා සිටුවීම සඳහා මුදල් සහ රාජ්‍ය මූල්‍ය සහන ලබාදීම විශාල ලෙස උපකාරී විය.

ඉහත සාකච්ඡාවට බඳුන් වූ අවස්ථා දෙකෙහිදීම ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලැබුයේ වත්කම් මිල බුබුළු පිපිරීමෙන් අනතුරුව ඒ හරහා ආර්ථිකයට ඇති වූ අහිතකර ප්‍රතිවිපාක අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ගයයි. මෙම ප්‍රවේශය සඳහා පාදක වූයේ වත්කම් මිල බුබුළු පිපිරීමෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට ගෙන ඒමේ පිරිවැය අඩුය යන උපකල්පනයයි. එයට පරස්පරව, වත්කම් මිල බුබුළු පිපිරීමෙන් පසුව ඇතිවන ප්‍රතිවිපාක සඳහා පිළියම් යෙදීම සඳහා වන පිරිවැය ඉතාමත්ම ඉහළ බව දැන් හඳුනාගෙන ඇති අතර, 2008-09 කාලයේ ඇතිවූ ගෝලීය මූල්‍ය අර්බුදය වැනි මූල්‍ය අර්බුද ඊට පසුව ඇතිවුවහොත්, එම පිරිවැය තවත් විශාල විය හැක. මෑතකදී ඇති වූ වත්කම් මිල බුබුළුවල විශේෂත්වය වූයේ ඒවා මිල හා ආර්ථික ස්ථායීතාව පැවතුණු කාලපරිච්ඡේදවල ඇති වීමයි. මේ හේතුවෙන් වත්කම් මිල බුබුළු ඇති වීමේ ප්‍රවණතාවයක් ඇති වන විට එම තත්ත්වය නිවැරදිකර ගැනීමේ අවශ්‍යතාවය වඩාත් ඉස්මතු වේ.

1 වත්කම්වල මිල ඒවායේ තාර්කිකව පැවතිය යුතු අගයට වඩා ශීඝ්‍රයෙන් ඉහළ යාම.

මෙම විවාදයේ දී, වත්කම් මිල බුබුළු වර්ග දෙකක් ඇත. 2008-09 ගෝලීය මූල්‍ය අර්බුදය මගින් පෙන්වා දෙන ආකාරයට එක් වර්ගයක් ණය මගින් උත්පාදනය වන බුබුළු වන අතර, එහි වැදගත්කම මූල්‍ය පද්ධතියට වඩාත් සමීප බැවින්, ඒවා ඉතාමත් අවදානම්කාරී ඒවා වේ. අනෙක් බුබුළු වර්ගය එපමණ අවදානම්කාරී නොවන අතර, මෙම බුබුළු අනවශ්‍ය ලෙස අධික ශුභවාදී අපේක්ෂා හේතුවෙන් ඇතිවන බැවින්, ඒවා මගින් මූල්‍ය පද්ධතියට වන බලපෑම සාපේක්ෂ වශයෙන් අඩුවේ. එමනිසා, බුබුළු වර්ග දෙකම ඇතුළත් වන වත්කම් මිල බුබුළු ඇතිවීම වළක්වා ගැනීමට වඩා, ණය මගින් උත්පාදනය වන බුබුළු වළක්වා ගැනීමට කටයුතු කිරීම වඩාත් වැදගත්ය.

වත්කම්වල මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යාමේදී මුදල් ප්‍රතිපත්තියෙහි භූමිකාව කෙසේ වියයුතුදැයි තරමක් අපැහැදිලි වේ. ලිහිල් මුදල් ප්‍රතිපත්තියක්, ආයෝජනයන්හි අවදානම්භාවය නොසලකා හරිමින් ප්‍රතිලාභය පිළිබඳ වැඩියෙන් සැලකිලිමත් වීමට අනුබල දීමේදී අවදානමක් පැවතිය හැක. මූල්‍ය වෙළෙඳපොළෙහි ඇති දිරිගැන්වීම් ක්‍රම, අවදානම ඉහළ වත්කම් එක්රැස්කර ගැනීමට ද පෙළඹවිය හැක. ලිහිල් මුදල් ප්‍රතිපත්තිය හරහා අවදානම් දැරීම් දිරිගැන්වෙන තවත් ක්‍රමවේදයක් වනුයේ ආදායම් හා තක්සේරු කිරීමේ ප්‍රතිවිපාකයන්ය. මූල්‍ය ආයතන බොහෝවිට මුදල් ණයට ලබා ගැනීමේදී කෙටිකාලීනව ඒවා එක්රැස් කර ගන්නා අතර, ඒ මගින් දිගුකාලීන ණයදීම සිදු කරයි. ලිහිල් මුදල් ප්‍රතිපත්තිමය වාතාවරණයක් ඇතිවිට ශුද්ධ පොලී ආන්තිකයන් වැඩි වනවා පමණක් නොව මෙම ආයතනවල වටිනාකම ද වැඩි වන අතර, මේ මගින් ණය ලබා ගැනීමේ හැකියාව වැඩි වේ. තවද, අඩු පොලී අනුපාතික පවතින විට ශේෂ පත්‍රයේ වත්කම් පැත්තෙන්, ඇප ලෙස තැබූ වත්කම්වල වටිනාකම් ඉහළ යා හැකි අතර, මෙමගින් නැවතත් ණය දීමේ හැකියාව පුළුල් කරයි. මෑත කාලයේ බොහෝ රටවල්වල වඩාත් පුරෝකථනය කළ හැකි මුදල් ප්‍රතිපත්තිමය දිශාවක් පැවතීම, දෙයාකාරයකින් අවදානම් ගැනීම දිරිමත් කිරීමට උපකාරී විය. පළමුව, වඩාත් පුරෝකථනය කළ හැකි මුදල් ප්‍රතිපත්තියක් මගින් අවිනිශ්චිතතාවය අඩු කළ හැකි අතර, මූල්‍ය වෙළෙඳපොළවල්වල අවදානම් අඩුවෙන් තක්සේරු කිරීමට මෙය දායක වෙයි. දෙවනුව, මූල්‍ය අර්බුදවලින් පසු වෙළෙඳපොළ නැවත යථා තත්ත්වයට පත් කිරීමට ගන්නා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් තම ආයතන අහිතකර ආයෝජනවලින් මුදවා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් ක්‍රියා කරනු ඇතැයි මූල්‍ය ආයතන අපේක්ෂා කරනු ලබයි. මෙවැනි අපේක්ෂාවන් මගින් මූල්‍ය සමාගම් විසින් කළයුතු වන වෙළෙඳපොළ සැකසීමේ ක්‍රියාකාරීත්වය දුර්වල කරයි.

මූල්‍ය වෙළෙඳපොළ නියාමකයන් සහ මහ බැංකු නිරන්තරයෙන්ම ණය හිමියන්ගේ ණය තත්ත්වය පිළිබඳව තොරතුරු ලබා ගනී. එබැවින්, ණය බුබුළු හට ගැනීමට පෙර එය ඇතිවන බව දැනගත හැකි වන අතර, ඊට පිළියම් ද යෙදිය හැකිය යන්න විවාදයට ලක් විය හැක. ණය මගින් හට ගන්නා බුබුළු හඳුනා ගැනීමේ හැකියාව, 2002-04 කාලපරිච්ඡේදය තුළ ඕස්ට්‍රේලියාවේ නිවාස වෙළෙඳපොළෙහි අසමතුලිතතාවයන් අනුකූලනය කිරීම සඳහා ක්‍රියාත්මක වූ "විවට සන්නිවේදන මෙහෙයුම්" (open mouth operations) ක්‍රියාමාර්ග හරහා ණය මගින් ඇතිවන වත්කම් මිල බුබුළු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමේ ක්‍රියාමාර්ග සඳහා පූර්වාදර්ශයක් පෙන්නුම් කරයි. සාර්ව විචක්ෂණශීලී දෘෂ්ටිකෝණයකින් බැලූ විට ණය බුබුළු ඇතිවීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට ප්‍රබල හේතු ඇත. පළමුව, ණය බුබුළු කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන කුමන හෝ ක්‍රමෝපායකදී පද්ධතිමය අසාර්ථකවීම්වලට පිළියම් යෙදිය යුතුය (වෙළෙඳපොළ අසාර්ථකවීම් නිවැරදි කිරීම). වෙළෙඳපොළ අසාර්ථකවීම ගැටළුවක් ලෙස හඳුනාගෙන ණය බුබුළු පාලනය කිරීම සඳහා විචක්ෂණශීලි නියාමන ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව සලකා බැලීම නොයෙක් ක්‍රියාමාර්ග හරහා සිදු විය හැකිය. ප්‍රමාණවත් හෙළිදරව්කිරීම් සහ ප්‍රාග්ධන අවශ්‍යතා, ද්‍රවශීල අවශ්‍යතා, කාලීන නිවැරදිකිරීම්, ආයතනවල අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිය සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය, රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කිරීමට මූල්‍ය ආයතන සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීම සහ අධීක්ෂකවරුන්ට ප්‍රමාණවත් සම්පත් ලබාදීම සහ ඔවුන් ඒ සඳහා වගකිවයුතු වීම යන කරුණු මෙයට අයත් වේ. වෙළෙඳපොළ අසාර්ථකවීම් ඇගයීමේදී ණය වෙළෙඳපොළ සමස්තයන් නියාමනය කිරීම තවත් ප්‍රවේශයක් වේ. ණය බුබුළු මැඩපවත්වා ගැනීම සඳහා භාවිතා කරන සාර්ව විචක්ෂණශීලි ප්‍රතිපත්ති අතර බැංකු මගින් ඉදිරි තත්ත්වයනට මුහුණ දීම සඳහා වර්තමාන අවිනිශ්චිත අවශ්‍යතාවලට වඩා වැඩි ප්‍රමාණයක ප්‍රතිපාදන වෙන් කිරීම, ණය ප්‍රසාරණය වන කාලයේදී ණය දීම් කපා හැරීම සහ මූල්‍ය ආයතනවල සමහර වගකීම් මත සෘණාත්මක බාහිරතා සඳහා අය කරනු ලබන බදු අය කිරීම යනාදිය පෙන්වාදිය හැක. මූල්‍ය ප්‍රතිපත්ති වශයෙන් සැලකූ විට, ණය වෙළෙඳපොළ සමස්තයන් කළමනාකරණය කිරීම සඳහා බොහෝ විට ශිෂ්ඨ ප්‍රයෝග හෝ විවට සන්නිවේදන මෙහෙයුම් යොදා ගත හැක. මෑතකාලීනව, ආර්ථිකයේ යම් අංශයක මිල ශීඝ්‍ර වෙනසකට ලක්වීම වැළැක්වීම සඳහා නිත්‍ය පහසුකම් ලබා ගැනීම පාලනය කිරීම, බහුවිධ පොලී අනුපාතික කවුළු, වෙළෙඳපොළ සංචිතයන්හි තුලනය පවත්වා ගැනීම සහ ණය කළමනාකරණය කිරීම සඳහා ණය ඉලක්ක භාවිතය යන ක්‍රියා මාර්ග මහ බැංකු විසින් සැලකිල්ලට භාජනය කර ඇත.

සාරාංශයක් ලෙස ගතහොත්, මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්ය භාරය ඉටු කිරීමේදී, වත්කම් මිල බුබුළු ඇතිවීම මැඩ

පවත්වා ගැනීමට වෙහෙසීමට වඩා වැදගත් වනුයේ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමට හැකිවන ලෙස ණය බුබුළු ඇතිවීම වළක්වා ගැනීම සඳහා ක්‍රියා කිරීමයි. මේ අනුව, ණය සම්මත ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යාම මැඩ පැවැත්වීමට මූල්‍ය ප්‍රතිපත්තිය සහ මූල්‍ය පද්ධතිය ස්ථායී කිරීමේ ප්‍රතිපත්තීන් වඩාත් ශක්තිමත් කළයුතු අතර, ඇතැම් අවස්ථාවලදී මූල්‍ය පද්ධතිය අස්ථායීවීම වැළැක්වීමට කටයුතු කිරීමේ දී දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළයුතු වේ.

මූලාශ්‍ර:


1. Kohn, D. L. (2006): Monetary Policy and Asset Prices. "Monetary Policy: A Journey from Theory to Practice," a European Central Bank Colloqium held in honor of Otmar Issing, Frankfurt.
2. Minford, P. (2007): Should Central Banks Target anything other than Inflation (such as Money Supply)?, Cardiff Business School.
3. Mishkin, F. S. (2008): How Should We Respond to Asset Price Bubbles?. At the Wharton Financial Institutions Center and Oliver Wyman Institute's Annual Financial Risk Round Table, Philadelphia.
4. Rajan, R. (2010): Fault Lines: How Hidden Fractures Still Threaten the World Economy, Princeton University Press.
5. Randazzo, A., Flynn, M. and Summers, A. B. (2009): Avoiding an American 'Lost Decade': Lessons from Japan's Bubble and Recession, Reason Foundation Policy Study. No. 373.
6. Shirakawa, M. (2010): Revisiting Monetary Policy. Comments at the IMF/ECB/FRB High-Level Conference, Washington DC.
7. White, W. R. (2009): Should Monetary Policy "Lean or Clean"?, Federal Reserve Bank of Dallas, Working Paper No.34.


## 7.5 අනාගත වර්ධනයන්, අභියෝග සහ ඉදිරි දැක්ම

**ගෝලීය සැපයුම් තත්ත්වයන්ගේ අවිනිශ්චිත බව හමුවේ වුවද, ඉල්ලුම් අංශයේ පීඩන සීමාකිරීම සඳහා සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යොදාගැනීම සහ දේශීය සැපයුම් තත්ත්වයෙහි තවදුරටත් සිදුවන වැඩිදියුණුවීම් උපයෝගී කරගෙන මතුපිට උද්ධමනය තනි අගයක පවත්වා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.** 2011 අවසානය වන විට, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය වසර 3 කට ආසන්න කාලයක් තුළ තනි අංකයක පවත්වාගනු ලැබිණි. කෙසේ වුවද, විශේෂයෙන්ම ආහාර සහ බලශක්ති ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩවල මිල ගණන්, දේශීය මිල ගණන්වලට අවිනිශ්චිත බවක් එක් කරමින් ඉහළ අගයක් වටා උච්චාවචනය වෙමින් පවතී. දේශීය වශයෙන් වැඩිදියුණු වූ ප්‍රවාහන සහ සන්නිවේදන පද්ධති, ඉහළ ගිය ඵලදායීතාව මෙන්ම නිෂ්පාදිතය ඉහළයාම පාරිභෝගික මිල ගණන් මත වන පීඩනය අඩු කිරීමට උපකාරී වනු ඇති අතර, ඉදිරි දැක්මක් සහිත රාමුවක් යටතේ ගනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2012 වසරේ දී පාරිභෝගික මිල උද්ධමනය තනි අංකයක තහවුරු කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. වසර තුළ දී ආර්ථිකයේ උද්ගත විය හැකි යම් අහිතකර තත්ත්වයන්ට මුහුණ දීම සඳහා රාජ්‍ය මූල්‍ය, මුදල් සහ විදේශීය අංශයේ ප්‍රතිපත්තිවලින් සමන්විත මනාව සැලසුම් කරන ලද ප්‍රතිපත්ති සංකලනයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

**මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව ශීඝ්‍රයෙන් වෙනස්වෙමින් පවතින තත්ත්වයක දී, මුදල් වෙළෙඳපොළ කෙටිකාලීන පොලී අනුපාතිකවල විචලනයන් අවම කිරීම සඳහා මහ බැංකුව දැඩි පරිශ්‍රමයක් දරනු ඇත.** පසුගිය දෙවසර තුළ වෙළෙඳපොළ සහභාගිවන්නන් වෙත පැවති අතිරික්ත ද්‍රවශීලතාව 2011 වසර තුළ ක්‍රමයෙන් අඩු වූ අතර, ඉන්පසුව වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත සහ හිඟ තත්ත්වයන් අතර විචලනය විය. බැංකු අතර ද්‍රවශීලතාව බෙදීයාමේ විෂමතාව මෙන්ම අන්තර් බැංකු වෙළෙඳපොළ තුළින් තම ද්‍රවශීලතා අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාගැනීමේ අවශ්‍යතාවය හේතුවෙන් වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්හි අනවශ්‍ය විචලනයක් දක්නට ලැබුණු අතර, සමස්ත වෙළෙඳපොළ ද්‍රවශීලතාව අතිරික්ත අගයක පැවතියද මහ බැංකුවේ මැදිහත්වීම අවශ්‍ය විය. ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම, කෙටිකාලීන වෙළෙඳපොළ කටයුතුවල නිරතවීම සඳහා වෙළෙඳපොළ සහභාගිවන්නන් උනන්දු කරවීම සහ රජයේ මූල්‍ය අවශ්‍යතාවන් සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය අධිකාරීන් සමග වඩාත් හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම, වෙළෙඳපොළ ද්‍රවශීලතාව වඩාත් හොඳින් කළමනාකරණය කිරීමට සහ වෙළෙඳපොළ පොලී අනුපාතික අභිමත මට්ටමේ පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වෙයි.

**වර්තමාන මුදල් සමස්ත ඉලක්ක කිරීමේ රාමුවෙහි සාර්ථකත්වය, මුදල් සැපයුම ඉදිරියේ වෙනස් විය යුතු ආකාරය නිසි ලෙස පුරෝකථනය කිරීමත් මුදල් ප්‍රතිපත්ති උපකරණ යොදාගනිමින් මුදල් සැපයුම එම අගයන් තුළ පවත්වා ගැනීමත් මත රඳා පවතී.** 2011 දී දක්නට ලැබුණු පරිදි, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි ඉහළ වර්ධනය මෙන්ම රාජ්‍ය අංශයේ ණය ගැනීම් ඉහළයාම මුදල් සමස්තයන් ඉලක්කගත මට්ටම ඉක්මවා යාමට හේතුවිය හැක. පෞද්ගලික අංශයේ ණය පොලී අනුපාතිකයන්ට සංවේදී වන බැවින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යොදාගනිමින් මෙය පාලනය කළ හැකි වන අතර, මුදල් සමස්තයන් අභිමත මට්ටම ඉක්මවා යාමේ අවදානම අවම කිරීමට සහ

7 මුදල් ප්‍රතිපත්තිය, මුදල්, ණය සහ පොලී අනුපාතික

පෞද්ගලික අංශය වෙත ආයෝජන සඳහා ප්‍රමාණවත් අරමුදල් ප්‍රමාණයක් පවත්වාගැනීම සඳහා රාජ්‍ය අංශය විසින් බැංකු මූලාශ්‍රයන්ගෙන් ලබාගන්නා ණය වසර ආරම්භයේ දී ඇස්තමේන්තුගත මට්ටම තුළ සීමාකිරීම අත්‍යවශ්‍ය වේ.

2012 වසරේ දී මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට තවදුරටත් කටයුතු කරනු ඇත. පසුගිය වසර කිහිපය තුළ දී ප්‍රධාන දියුණු ආර්ථිකයන්හි මහ බැංකු විසින් ඒවායේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යාමේ දී මුදල් සහ ණය ප්‍රමාණයන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම තුළින් පැහැදිළිවනුයේ විශ්වාසදායී මුදල් ප්‍රතිපත්ති රාමුවක් ලෙස මුදල් සමස්ත ඉලක්ක කිරීමේ ක්‍රමවේදය තවදුරටත් වැදගත් වන බවයි. අනාගතයේ දී වඩා පැහැදිලි රාමුවක් තුළ උද්ධමනය සඳහා පැහැදිලි ඉලක්කයක් පවත්වා ගනිමින් වඩාත් පුළුල් මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ දර්ශක සමූහයක් යොදාගැනීම උද්ධමන අපේක්ෂාවන් මෙහෙයවීමට ප්‍රයෝජනවත් වන අතර මැදිකාලීනව ආර්ථික සහ මිල ස්ථායීතාව සාර්ථකව පවත්වා ගැනීමට ද එය උපකාරී වනු ඇත.